(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 3(1).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2016 මැයි මස 06 වැනි සිකුරාදා

## 2016 මැයි මස 17 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු ගිවිසුම (අපරානුමත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 07 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

### 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 07 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) සහ 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 01002 "අල්ලස් චෝදනා විමර්ශන කොමිෂන් සභාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි. — "අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 12,000,000 සිට රු. 250,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |

| | | |
|---|---|---|
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 20,000,000 සිට රු. 275,000,000 දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2015.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2016.04.25 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 08 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 8 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) සහ 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 2,500,000,000 සිට රු. 3,950,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000 සිට රු. 3,000,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 1,900,000,000 සිට රු. 2,500,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2015.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2016.04.25 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 09 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 09 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) සහ 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 22302 "ගබඩා අත්තිකාරම් ගිණුම (පුපුරණ ද්‍රව්‍ය) - ශ්‍රී ලංකා නාවික හමුදාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 338,000,000<br>රු. 345,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2015.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2016.04.25 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 10 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 10 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) සහ 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 "ගබඩා අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| අයිතමය | | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,800,000,000 සිට රු. 1,200,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 1,000,000,000 සිට රු. 1,500,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2015.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2016.04.25 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 11 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 11 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) සහ 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 31003 "කළ වැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| අයිතමය | | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 260,000,000 සිට රු. 308,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |

| | | |
|---|---|---|
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2015.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2016.04.25 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 12 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 12 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) සහ 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 31002 "ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 120,000,000<br>රු. 80,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 40,000,000<br>රු. 80,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2015.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2016.04.25 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 7),— 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) සහ 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතේ අංක 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## උපලේඛනය
## 2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධාන

2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2015 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

### කණ්ඩායම් විධාන අංක 01

2014 අංක 41 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතලවලට අනුව රවී කරුණානායක වන මම, මුදල් අමාත්‍යවරයා වශයෙන් ආණ්ඩුවේ අනුමතියට යටත්ව මේ සමඟ දක්වා ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල විෂය අංක 12101, 16401, 16501, 19601, 19701 සහ 19801ට අදාළ වන්නා වූ 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) සහ 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතේ තෙවැනි උපලේඛනය තීරු අංක II සහ IV හි දක්වා ඇති උපරිම සීමාවන් සහ අංක III හි දක්වා ඇති අවම සීමාවන් සංශෝධනය කරමි.

| අනු අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 12101 | 5,500,000 | 30,000,000 | - | - | 15,000,000 | 350,000,000 | 1 |
| 2 | දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | 16401 | 2,000,000 | 0 | 10,000 | 0 | 10,000,000 | 0 | 2 |
| 3 | ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය | 16501 | 2,000,000 | 0 | 20,000 | 0 | 10,000,000 | 0 | 3 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 4 | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 19601 | 4,000,000 | 20,000,000 | - | - | - | - | 4 |
| 5 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 19701 | 30,000,000 | 10,000,000 | 10,000,000 | 6,000,000 | 90,000,000 | 40,000,000 | 5 |
| 6 | වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 19801 | - | - | - | - | 20,000,000 | 23,000,000 | 6 |

(මෙම නියමය වලංගු වන්නේ 2015.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2016.04.25
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)



* සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.

## 2016 ජූනි මස 07 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

58/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2013 සහ 2014 යන වර්ෂයන්හි උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරුන් විදේශ සංචාරයන් සඳහා රජයේ වියදමින් සහභාගී වී තිබේද;

(ii) එසේ නම්, එම විදේශ සංචාර සඳහා සහභාගී වූ මන්ත්‍රීවරුන් ගණන හා ඔවුන්ගේ නම් කවරේද;

(iii) එම මන්ත්‍රීවරුන්ගේ විදේශ සංචාරයන් සඳහා පළාත් සභාව වියදම් කළ මුදල, එක් එක් මන්ත්‍රීවරයාට වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත මන්ත්‍රීවරුන් විදේශ සංචාරයන්ට සහභාගී වූ හේතු කවරේද;

(ii) එම සංචාරයන්ගෙන් රටට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මන්ත්‍රීවරුන්ට අමතරව පළාත් සභාවේ වියදමින් වෙනත් පුද්ගලයින් විදේශ සංචාරයන්ට සහභාගී වී තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එම පුද්ගලයින් විදේශගත වීමට හේතු කවරේද;

(iv) එයින් රටට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

297/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මූලික අධ්‍යාපනය සඳහා පාසලක් නොමැති වීම නිසා අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අළුත් දෙන්නෑව ගම්මානයේ මුස්ලිම් දරු දැරියන් 200කට අධික පිරිසකට දුර බැහැර පාසල්වලට යැමට සිදුවී තිබෙන බවත්;

(ii) සුදුසු මාර්ග පද්ධතියක් හෝ පොදු ප්‍රවාහන සේවයක්ද නොමැතිව, දිනපතා කි. මී. 10කට ආසන්න දුරක් පයින් ගමන් කිරීමට සිදු වීමෙන් එම දරු දැරියන් මුහුණ දෙන දුෂ්කරතා සැලකිල්ලට ගෙන ප්‍රදේශවාසීන් විසින් අක්කර 1½ක පමණ ඉඩමක ගොඩනැගිලි දෙකක් ඉදිකරන ලද බවත්;

(iii) එකී ඉඩම සහ ගොඩනැගිලි රජයට පවරා ගෙන එය පිළිගත් පාසලක් බවට ප්‍රකාශයට පත්කිරීමට යෝජනා කරන ලද බවත්;

(iv) ඒ සඳහා අංක උමප/කැකි/අසං - 01/23 II වෙළුම හා 2011.01.14 දිනැති ලිපිය මඟින් කැකිරාව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් උතුරු මැද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට නිර්දේශයක් ඉදිරිපත් කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) දුෂ්කර ගම්මානයක වෙසෙන එම දරු දැරියන්ගේ යහපත උදෙසා දෙන්නෑව ගම්මානයේ රජයේ පාසලක් ස්ථාපිත කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

319/’15

ගරු ජයන්ත සමරවීර මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015.11.15 දින වනවිට ශ්‍රී ලංකාව තුළ රජය සතු ඉඩම් ප්‍රමාණය;

(ii) එකී ඉඩම් අතරින් බදු දී ඇති ඉඩම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජය සතු එක් එක් ඉඩමේ නම හා ප්‍රමාණය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) බදු දී ඇති එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, බදු දී ඇති කාලය, වාර්ෂික බදු කුළිය හා ඉඩම පිහිටා තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා දිස්ත්‍රික්කය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට රජය සතු ඉඩම් විකිණීමට හෝ බදුදීමට සැලසුම් කොට තිබේද;

(ii) විකිණීමට හෝ බදු දීමට සැලසුම් කොට තිබෙන ඉඩම් කවරේද;

(iii) එම ඉඩම් විකුණනු ලබන හෝ බදු දෙනු ලබන පුද්ගලයින් කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

348/’15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය සමයේ කොටස් වෙළඳපොළ තුළ සිදු වූ වංචා හා දූෂණ මේ වනවිටත් සිදුවන්නේද;

(ii) එසේ නොවේ නම්, ඒ හරහා ලබාගත් ප්‍රගතිය කවරේද;

(iii) සිදුකර ඇති වංචා හා දූෂණ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන්නේද;

(iv) එසේ නම්, එම පරීක්ෂණවල වර්තමාන තත්ත්වය කවරේද;

(v) පරීක්ෂණවලින් වැරදිකරුවන් වන පුද්ගලයින්ට එරෙහිව නීතිමය පියවර ගැනීමේ වගකීම භාර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

394/’15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2015 මුදල් වර්ෂය තුළදී,

(i) අපේක්ෂා කළ බදු සහ බදු නොවන ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සත්‍ය බදු සහ බදු නොවන ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සත්‍ය බදු සහ බදු නොවන ආදායම, අපේක්ෂිත බදු සහ බදු නොවන ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 ආදායම සමඟ සාපේක්ෂව සැසඳීමේදී, 2016 අපේක්ෂිත ආදායම කෙතරම් දුරට යථාර්ථවාදීද;

(ii) 2016 වියදම් ශීර්ෂ ආදායම සමඟ ගැලපීමේදී කපා හැරෙන වියදම් මොනවාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

451/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා නිකුත් කරනු ලබන අත් පොතේ සඳහන් ආකාරයට 2006 - 2009 දක්වා වසර 04 තුළදී රාජ්‍ය විශ්වවිද්‍යාලවල එක් එක් පාඨමාලා සඳහා බඳවා ගැනීමට නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම එක් එක් පාඨමාලාව සඳහා 2006 - 2009 දක්වා වසර 04 තුළ සත්‍ය වශයෙන්ම බඳවාගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

461/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහජන බැංකුවේ විශ්‍රාමිකයන්ට ගෙවිය යුතු වෙනස්වන ජීවන වියදම් දර්ශක දීමනාව, විශ්‍රාම භාර අරමුදලේ මූලික රෙගුලාසිවලට පටහැනිව සහ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරමින්, විශ්‍රාමිකයින්ගෙන් එක්තරා පිරිසකට ගෙවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ හේතුවෙන් මහජන බැංකුවේ ඇතැම් විශ්‍රාමිකයන්ට මාසිකව රු.20,000/- පමණ ජීවන වියදම් දීමනාව අහිමි වී තිබෙන බවත්;

(ii) අනෙකුත් සියලු රාජ්‍ය බැංකුවල විශ්‍රාම වැටුප් ගෙවීමේදී අද දක්වා වෙනස්වන ජීවන වියදම් දීමනාව නිසි පරිදි ගෙවනු ලබන අතර, ඉන් බැහැරව එකම තරාතිරමේ සේවක පිරිසකට දෙයාකාරයකින් සලකා කටයුතු කරනු ලබන එකම රාජ්‍ය බැංකුව, මහජන බැංකුව බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) අනෙකුත් රාජ්‍ය බැංකුවල විශ්‍රාමිකයන්ට ගෙවනු ලබන මාසික ජීවන වියදම් දීමනාව පිළිබඳ සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(ii) මහජන බැංකුව පමණක් විශ්‍රාමිකයින් කාණ්ඩයකට ජීවන වියදම් දීමනා ගෙවීමේදී වෙනස් ආකාරයකට සැලකීම සම්බන්ධයෙන් කඩිනම් විසඳුමක් ලබා දෙන්නේද;

(iii) 1996 වර්ෂයේ සිට වෙනස්වන ජීවන වියදම් දීමනාව කැටිකර ගෙවීම, අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකින් තොරව හිටපු සාමාන්‍යාධිකාරීවරයෙකු විසින් ලාභය වැඩිකර පෙන්වීම සඳහා ගනු ලැබූ හිතුවක්කාර තීන්දුවක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

485/'16

ගරු කනක හේරත් මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය තුළදී දිවයිනෙන් වාර්තා වූ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාවෙන් ජීවිතක්ෂයට පත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) දැනට ක්‍රියාත්මක ඩෙංගු රෝග මර්දන වැඩපිළිවෙළ සාර්ථක වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2016 වර්ෂයේදී දිස්ත්‍රික්ක මට්ටමින් ඩෙංගු රෝග මර්දනයට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඒ සඳහා වැඩි ජන සහභාගීත්වයක් ලබා ගැනීමේ ක්‍රමවේදයක් සැලසුම්කර තිබේද;

(iii) එසේ නම්, එමඟින් ඩෙංගු රෝගය මර්දනය කර ගැනීමට හැකියාවක් පවතින බව විශ්වාස කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

94/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විගණකාධිපති වාර්තා අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාව හා නොසැලකිලිමත්භාවය හේතුවෙන් රජයට අහිමි වී ඇති මුදල රුපියල් බිලියන 388ක් බවත්;

(ii) මෙම මුදලට වැට් බදු මුදල් වංචාවේ රුපියල් බිලියන 3.9ක මුදලද ඇතුළත් බවත්;

(iii) ඒ අනුව වැට් බදු වංචාවෙන් රජයට අහිමි වූ මුදල, රජයට අහිමි වූ සමස්ත මුදලෙන් ආසන්න වශයෙන් 0.5% ක් පමණක් වන බවත්;

(iv) ඉතිරි 99.5% පිළිබඳව මෙතෙක් පරීක්ෂණ සිදු වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වැට් බදු මුදල් වංචාව හැරුණු කොට ඉතිරි රුපියල් බිලියන 384.1ක් රජයට අහිමි කිරීම සම්බන්ධයෙන් වගකිවයුත්තන් පිළිබඳව විමර්ශනය කර තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ලිපින, දුරකථන අංක හා තරාතිරම් කවරේද;

(iii) මෙම පුද්ගලයන් සම්බන්ධව ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

380/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය මගින් ගිං ගඟ හා නිල්වලා ගඟ පිටාර ගැලීම නැවැත්වීම සඳහා ව්‍යාපෘතියක් සකස් කර තිබේද;

(ii) එවැනි ව්‍යාපෘතියක් සඳහා චීනයේ CAMC ඉන්ජිනියරින් කොම්පැණි ලිමිටඩ් නමැති සමාගමක් සමඟ ගිවිසුමක් අත්සන් කොට තිබේද;

(iii) එසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ගිවිසුමක් අත්සන් නොකර ඉහත සමාගමට 2014.12.31 දින වවුචර් අංක 2568 මඟින් රු. 998,576,311/=ක් සහ 2015.01.31 දින වවුචර් අංක 99/1 මඟින් රු.1003,136,336/=ක් හා වවුචර් අංක 99/2 මඟින් රු. 2009,342,336/=ක් ගෙවා තිබෙන බව දන්නේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ තොරතුරු කවරේද;

(vi) එලෙස මුදල් ගෙවා ඇති පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය සඳහා 2015 අයවැයෙන් රුපියල් මිලියන 40ක මුදලක් පමණක් වෙන් කර තිබියදී මෙපමණ මුදල් ප්‍රමාණයක් ගෙවන්නේ කෙසේද;

(ii) මෙසේ ගෙවා තිබෙන මුදල සාධාරණීකරණය කරන්නේද;

(iii) එසේ නම්, ඒ මන්ද;

(iv) එසේ නොවේ නම්, මේ සඳහා වගකිවයුත්තන් කවුරුන්ද;

(v) ඔවුන්ට දඬුවම් කරන්නේද;

(vi) ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

434/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අ.පො.ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල සඳහා සිසුන් බඳවා ගැනීමේදී එක් එක් දිස්ත්‍රික්කය අනුව අවම ලකුණු නිර්ණය කිරීමට යොදා ගන්නා ක්‍රමවේදය කවරේද;

(ii) එම ක්‍රමවේදය භාවිතා කිරීම ආරම්භ කළ වර්ෂය කවරේද;

(iii) එම ක්‍රමවේදය වර්තමානයට කෙතරම් දුරට ගැලපේද යන්න අධ්‍යයනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

459/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2014 දී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිකිරීම් ආරම්භ කරන ලද කොළඹ 06, කිරුළපන, මිහිඳුපුර මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එම නිවාස ව්‍යාපෘතිය අවසන් කරන ලද දිනය කවරේද;

(iii) ඉදිකිරීම් නිම කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් භාරව කටයුතු කළ දේශීය සමාගම, අක්කර 2ක් පමණ වූ එම රජයේ භූමිභාගය තම පෞද්ගලික බර වාහන ගාල්කිරීමට භාවිතා කරන බව දන්නේද;

(ii) මෙම ඉඩම පාවිච්චි කිරීම වෙනුවෙන් එම සමාගම රජයට ගෙවනු ලබන මාසික බදු කුලිය කොපමණද;

(iii) බදු කුලී නොගෙවා ඉඩම පරිහරණය කරන්නේ නම්, ඒ සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

486/'16

ගරු කනක හේරත් මහතා,— පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සමහර රූපවාහිනී නාලිකාවල විකාශනය වන ළමා වැඩසටහන් නියමිත ප්‍රමිතියෙන් තොර බවත්;

(ii) එමගින් ළමා පෞරුෂ වර්ධනය හා නිර්මාණ ශක්තිය හානියට ලක් වන බවත්;

(iii) මේ හේතුවෙන් සමාජය පරිහානියට පත්වීමේ අවදානමක් පවතින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඵලදායී ළමා සංවර්ධන වැඩසටහන් ඉදිරිපත් කිරීමේ වැඩපිළිවෙළක් අමාත්‍යාංශය සතුව තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 ජූනි මස 08 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

77/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2014.07.01 දින සිට ආනයනය තහනම් කරනු ලැබූ ආහාර සඳහා යොදන රසකාරක වර්ග කවරේද;

(ii) එම එක් එක් රසකාරක වර්ගය, තහනම් කිරීමට හේතුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත තහනම් කළ රසකාරක මෙන්ම, අජිනමොටෝ නොහොත් මොනෝසෝඩියම් ග්ලූටමේට් (MSG) රසකාරකය ද මිනිස් සිරුරට අහිතකර බවත්;

(ii) එය පිළිකා, ස්නායු ආබාධ ඇතුළු දරුණු රෝගාබාධ සඳහා හේතු කාරක වන බවත්;

(iii) වසරකට එම රසකාරක මෙට්‍රික් ටොන් 2200කට වැඩි ප්‍රමාණයක් මෙරටට ආනයනය කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මොනෝසෝඩියම් ග්ලූටමේට් භාවිතය තහනම් කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

409/'16

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ධීවර සමිතියක් වෙනුවෙන් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව විසින් රුපියල් ලක්ෂ 750ක මුදලක් දේශපාලනඥවරියකට ලබාදී තිබේද;

(ii) ඇයගේ නම කවරේද;

(iii) එසේ නම්, එම ණය මුදල ලබාදීම සඳහා ඇපයට තබාගෙන ඇති දෑ කවරේද;

(iv) එම ණය මුදලෙන් මේ වනවිට කොපමණ ආපසු අය කරගෙන තිබේද;

(v) එසේ නොමැති නම්, දිගින් දිගටම ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(vi) ඒ පිළිබඳව සම්පූර්ණ විස්තරයක් සභාගත කරන්නේද;

(vii) ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවෙන් ලබාදෙන ණය සඳහා පන්සල්වල ඔප්පු, කල්බදු ක්‍රමයට රජයෙන් ලබාගත් ඉඩම් හෝ තිරුවානා ගල් ඇපයට තබාගත හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

435/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 ජනවාරි 16 දින හෝ ඒ ආසන්න දිනයකදී බේස්ලයින් පාරේ, දෙමටගොඩ, ඥාණසිංහාරාමය විහාරය ඉදිරිපස ඇති පාර මාරුවීමේ කහ ඉරි තීරුව මත මවක් සහ දියණියක් වාහනයක ගැටී මියගිය බවත්;

(ii) එම කහ ඉරි තීරුව මත මීට පෙරද අනතුරු ගණනාවක් සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම කහ ඉරි තීරුව දෙපස මාර්ගය බෑවුම් සහිත වීමද මෙසේ අනතුරු බහුලවීමට හේතු වී ඇති බව පිළිගන්නේද;

(ii) මෙතරම් අනතුරු සිදු වී තිබියදී එම කහ ඉරි තීරුව විකල්ප ස්ථානයකට ගෙන යාමට හෝ එම තීරුව දෙපස මාර්ග සංඥා සවිකිරීම සිදු නොකලේ මන්ද;

(iii) එම කහ ඉරි තීරුව විකල්ප ස්ථානයකට ගෙන යාම හෝ එම තීරුව දෙපස මාර්ග සංඥා සවි කිරීම සිදු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

471/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට අයත් සියලු දුරකථනවලින් අයකරනු ලබන බදු වර්ග හා බදු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එකී බදු සියල්ල එකතු වූ පසු මුළු අයකිරීමේ ප්‍රතිශතයක් ලෙස ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට කොපමණ අය කිරීමක් කළ හැකිද;

(iii) එම අයකිරීම් කරනු ලබන්නේ කුමන නිශ්චිත වගන්තියක් යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

483/'16

ගරු කනක හේරත් මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය ඇරඹූ අධිවේගී මාර්ගවලින් 2015.12.31 දක්වා ලැබූ ආදායම කොපමණද;

(ii) එම ආදායම, අපේක්ෂිත ඉලක්කය ඉක්මවා තිබේද;

(iii) එසේ නම්, රටෙහි ආර්ථිකයට මෙම අධිවේගී මාර්ග මඟින් ප්‍රතිලාභ අත්වන බව පිළිගන්නේද;

(iv) යෝජිත කොළඹ - නුවර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සිදු කරන්නේද;

(v) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂය අවසාන දීර්ඝ නිවාඩු සමයේදී අධිවේගී මාර්ගවල දැඩි වාහන තදබදයක් තිබූ බව පිළිගන්නේද;

(ii) එවැනි තදබදයක් ඉදිරියේදී ඇති වීම වළක්වා ගැනීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

498/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ඖෂධ වෙළඳසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ සිටින සහතිකලත් ඖෂධවේදීන් සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 2011-2015 දක්වා ඖෂධවේදී බාහිර විභාගය සඳහා ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වර්ෂ 2011-2015 දක්වා එම විභාගය සමත් වූ සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) දිවයිනෙහි ඖෂධවේදීන්ගේ හිඟයක් ඇති බව පිළිගන්නේද;

(vi) එසේ නම්, එම හිඟය මඟහැරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

500/'16

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඈත අතීතයේ සිට ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, කින්නියා ගම්මානයේ මුස්ලිම් ජනතාව ජීවත් වූ බවත්;

(ii) එම ප්‍රදේශයේ පැවති ත්‍රස්තවාදී ගැටුම් හේතුවෙන් අවතැන් වූ මුස්ලිම් ජනතාව මෙතෙක් එම ගම්මානයේ නැවත පදිංචි කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ත්‍රස්තවාදී ගැටුම් හේතුවෙන් කින්නියා ගම්මානයේ අවතැන් වූ මුස්ලිම් පවුල් සංඛ්‍යාව සහ එම පවුල්වල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම ජනතාව එහි නැවත පදිංචි කිරීමට හැකි ඉක්මනින් කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

553/'16

ගරු අලී සාහීර් මවුලානා සෙය්යිද් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කළුදාවල ගම්මානයේ ජීවත්වන පවුල් 1500 කට ආසන්න පිරිසක් ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය ලෙස බුලත් වගා කිරීමේ කටයුතුවල නියැලෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) බුලත් වගාව සාර්ථක ලෙස සිදු කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන, “බුලත් කොවුල්” පොතුවිල්, රොට්ටකුලම් ප්‍රදේශයේ සිට කපා ප්‍රවාහනය කිරීමට තහනමක් පනවා තිබේද;

(ii) එසේ නම්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අංක: බුලත් කොවුල් 2011 හා 2014.05.13 දිනැති චක්‍රලේඛය අනුව, ඔවුන්ට ඒ සඳහා අවසර ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 ජූනි මස 09 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

117/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014.05.01 දින පුරප්පාඩු වූ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා නිලධාරියෙකු පත්කළ ක්‍රමවේදය කවරේද;

(ii) උක්ත තනතුර දැරීමට සම්පූර්ණ කළ යුතු, අධ්‍යාපන හා රාජ්‍ය සේවයේ නියමිත මූලික සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2014.06.02 දින ඉහත තනතුරට තාවකාලික පදනමින් අනුයුක්ත කළ ඉන්ද්‍රාණී මංගලිකා වික්‍රමනායක යන නිලධාරිනියගේ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඇය 2003.03.03 දින සිට 2013.02.11 දින දක්වා නිත්‍ය රාජ්‍ය සේවයේ කෙතරම් කාලයක් සේවය කර තිබේද;

(v) වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි වැඩ බැලීම සඳහා නිලධාරියකු පත් කළ යුත්තේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම නිලධාරිනියට එරෙහිව මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව මඟින් පරීක්ෂණයක් සිදු කරන බව දන්නේද;

(ii) එසේ නම්, එවැනි නිලධාරිනියකට අධ්‍යක්ෂ ජනරාල් තනතුරක් ලබාදීමේ නීත්‍යානුකූල පදනම කවරේද;

(iii) අදාළ පත්වීම බල රහිත කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ කවදාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

464/’16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 ජනවාරි 01 දිනට ජනාධිපතිතුමා විසින් සිය කාර්ය මණ්ඩලයට පත්කර ඇති සියලුම උපදේශකවරුන්, ලේකම්වරුන්, සම්බන්ධීකරණ නිලධාරින්, පෞද්ගලික සහකාරවරුන් සහ වෙනත් එවැනි නිලධාරින් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත (i) අනුව මුළු නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (i)හි නිලධාරීන්ගේ නම් සහ එක් එක් නිලධාරියාට ලබා දී ඇති වැටුප්, දීමනා, කාර්ය මණ්ඩල සහ පහසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (i)හි නිලධාරීන්ගේ අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

490/'16

ගරු කනක හේරත් මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015-2016 වර්ෂය සඳහා සමෘද්ධි සහනාධාරය ලබාදීම සඳහා සළකා බලනු ලැබූ නිර්ණායක කවරේද;

(ii) එම නිර්ණායකවලට අනුකූලව සමෘද්ධි සහනාධාර ලබා දී ඇති බවට සෑහීමකට පත් වන්නේද;

(iii) සහනාධාර ලැබිය යුතු නමුත් දැනට සහනාධාර නොලබන පවුල් සිටින බව පිළිගන්නේද;

(iv) ඔවුන්ට සහනාධාර ලබා දීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

555/'16

ගරු අලී සාහීර් මවුලානා සෙය්යිද් මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල, මහ වීදිය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ගල්හින්න, නුවර පාර, අංක 262/2 දරන ස්ථානයේ පදිංචි ඒ.එච්.එම්. හනීෆා සහ යූ.එම්.ඒ.එල්. සලාහුදීන් යන මහත්වරුන්ට අයත්, මු.පි.ක. 2285 හි කැබලි අංක 101 දරන පෞද්ගලික ඉඩම, අංක 1306/37 හා 2003.09.19 දිනැති රජයේ ගැසට් නිවේදනය මඟින් අත්පත් කර ගන්නා ලද බවත්;

(ii) වසර 10කට පෙර පවරාගනු ලැබූ එම ඉඩම සහ කඩා ඉවත්කරන ලද ව්‍යාපාරික ගොඩනැගිල්ල වෙනුවෙන් වන්දි මුදල් මේ දක්වා ප්‍රදානයකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ඉඩම සහ කඩා ඉවත් කරන ලද ව්‍යාපාරික ගොඩනැගිල්ල වෙනුවෙන් අදාළ වන්දි මුදල නොපමාව ලබාදීමට පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

556/'16

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට රාජ්‍ය සේවය තුළ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු පවතින ක්ෂේත්‍ර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පුරප්පාඩු සඳහා රැකියා විරහිත උපාධිධාරීන් බඳවා ගන්නේද;

(iv) එසේ නම්, ඒ කවර ක්ෂේත්‍ර සඳහාද;

(v) පුරප්පාඩු සඳහා බඳවාගත හැකි උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(vi) පුරප්පාඩු සඳහා රැකියා විරහිත උපාධිධාරීන් බඳවාගනු ලබන කාලවකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

566/'16

ගරු විදුර වික්‍රමනායක මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික් ලේකම්වරයා විසින් 2014 සහ 2015 වර්ෂවලදී විජයග්‍රහණ සැමරුම් උත්සවය සඳහා මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි කොටුවේගොඩ ග්‍රාමනිලධාරී වසමේ, මාතර, වෙරළ පාර, අංක 47 දරන ඉඩම, බත්තරමුල්ල, පැලවත්ත, සපුමල් පෙදෙසේ, අංක 793හි පදිංචි සිරාජ් කාදර් මහතාගෙන් තාවකාලිකව ලබාගෙන ආපසු භාර දී ඇති බවත්;

(ii) 2014 පැවති සැමරුම් උත්සවයෙන් පසුව කාදර් මහතා වෙත ආපසු භාරදුන් එම ඉඩම, ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 2 වගන්තිය යටතේ අත්පත්කර ගැනීම සඳහා 2014.12.04 දින මාතර ප්‍රාදේශීය ලේකම් විසින් නිවේදනයක් නිකුත්කර ඇති බවත්;

(iii) ඉහත අ(i)හි සඳහන් ඉඩම අත්පත්කර ගැනීමේ නිවේදනය අවලංගු කරන මෙන් කාදර් මහතා විසින් 2014.12.19 දිනැති ලිපිය මඟින් ඉල්ලීමක් කර ඇති බවත්;

(iv) මේ දක්වා අදාළ නිවේදනය අවලංගු නොකිරීම හේතුවෙන් එම ඉඩම ඵලදායී ආකාරයට සංවර්ධනය කිරීමට හැකියාවක් හිමිකරුට ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ඉඩම අත්පත්කර ගැනීමේ නිවේදනය අවලංගු කිරීම සඳහා කඩිනම් පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

568/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ප්‍රවාහන කොමිසම මඟින් ආරම්භ කරන ලද GPS තාක්ෂණය යෙදවීමේ ව්‍යාපෘතියෙහි අරමුණු කවරේද;

(ii) එමඟින් බස් මගීන්ට ලබා දීමට අපේක්ෂා කළ සේවා වැඩිකිරීම් කවරේද;

(iii) සවිකරන ලද GPS යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iv) GPS යන්ත්‍ර සවිකිරීම සඳහා යෙදවූ මහජන මුදල් ප්‍රමාණය කොපමණද;

(v) ඒ සඳහා බස් හිමියන්ගෙන් මුදලක් අයකර ගත්තේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2014 වර්ෂය ආරම්භයේ සිට මෙම යන්ත්‍ර නඩත්තුව සඳහා මුදල් ගෙවීම නතර කර තිබේද;

(ii) එසේ නම්, ඒ නඩත්තු සේවා ගිවිසුමේ කවර පරිච්ඡේදයකට අනුවද;

(iii) සේවා ගාස්තු ගෙවීම නතර කිරීම සඳහා බස් හිමියන්ගේ එකඟතාවය ලැබුණේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සවි කරන ලද GPS යන්ත්‍ර ක්‍රියාත්මකව පැවතියේද;

(ii) 2014 වර්ෂයේ අග භාගයේ සිට සියලුම GPS යන්ත්‍ර අක්‍රියවී තිබේද;

(iii) ඒ හේතුවෙන් බස් හිමියන්ට තමන්ගේ බස් රථ ධාවනය සම්බන්ධයෙන් GPS යන්ත්‍ර හරහා නිරීක්ෂණය කිරීමට නොහැකිවී තිබේද;

(iv) ඉහත අ(i) හි අරමුණු සාක්ෂාත් කරගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

570/'16

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පළමු අදියර සඳහා රුපියල් මිලියන 15ක් අනුමත වී ඇති අනුරාධපුර මහ නගර සභාවේ, මාළු වෙළඳසැළ පෙදෙස ඇතුළුව සතිපොළ භූමිය නව ඉදිකිරීම් සහිතව නවීකරණය කිරීමේ හා අපිරිසිදු ජලය ඉවත් කිරීමේ ව්‍යාපෘතියෙහි;

(i) පළමු අදියර අවසන් කර, සැලසුම් කළ පරිදි දෙසැම්බර් 31ට පෙර ජනතා අයිතියට පත් කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) දෙවන අදියර සඳහා මුදල් වෙන්කර තිබේද;

(iv) එසේ නම්, එම අදියර ආරම්භ කරන දිනය කවරේද;

(v) දෙවන අදියර අවසන්කර ජනතා අයිතියට පත්කිරීමට සැලසුම් කර ඇති දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

128/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අතීතයේ සිට පැවත එන දේශීය වී වර්ග වගා කිරීම සඳහා කෘෂි රසායන ද්‍රව්‍ය අවශ්‍ය නොවන බවත්;

(ii) දේශීය පැරණි වී ප්‍රභේද වගා කිරීමේදී අවම ජල ප්‍රමාණයක් අවශ්‍ය වන අතර පාරම්පරික ක්‍රම භාවිතයෙන් පරිසරයට හා මිනිසාට සිදුවන හානිය අවම බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට හඳුනාගෙන ඇති, ශ්‍රී ලංකාවේ භාවිතා කළ පැරණි වී වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම වී වර්ගයන්ගේ නම් කවරේද;

(iii) දැනට වගා කරන පැරණි වී වර්ග කවරේද;

(iv) අනෙකුත් පැරණි වී වර්ග වගා නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2014 වනවිට දේශීය පැරණි වී වර්ග, බීජ වී ලෙස යොදා ගෙන වගා කරනු ලබන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ශ්‍රී ලංකාව පුරා එම බීජ වී ව්‍යාප්ත කිරීමට පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

465/’16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වසර තුළ ජනාධිපතිතුමා සහභාගි වූ විදේශ සංචාර කවරේද;

(ii) එකී එක් එක් විදේශ සංචාරයට සහභාගී වූ පුද්ගලයින්ගේ නම්, තනතුර සහ එම පුද්ගලයින් වෙනුවෙන් රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන විසින් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

491/’16

ගරු කනක හේරත් මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දින 100 වැඩසටහන යටතේ නිදහස් වයි-ෆයි කලාප ඇති කිරීමේ ව්‍යාපෘතිය මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(ii) මේ යටතේ ඇතිකල නිදහස් වයි-ෆයි කලාප ප්‍රමාණය කොපමණද;

(iii) ඒ පිළිබඳව සෑහීමකට පත් වන්නේද;

(iv) ඒවා ක්‍රියාත්මක තත්ත්වයේ පවතීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කෑගල්ල දිස්ත්‍රික්කය තුළ නිදහස් වයි-ෆයි කලාප පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන කවරේද;

(iii) ඉදිරියේදී නිදහස් වයි-ෆයි කලාප ඇති කරන ප්‍රදේශ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

564/’16

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝලෙවල් පාර, අඹතලේ සිට ඔරුගොඩවත්ත දක්වා කොටස සංවර්ධනය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වැඩපිළිවෙළක් තිබෙන බවත්;

(ii) ඒ සඳහා පළමු වටයේ වන්දි ලබාදීම සිදුකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අනෙකුත් වන්දිලාභීන්හට වන්දි මුදල් ලබාදීම සිදු කරනු ලබන අදියර සංඛ්‍යාව කවරේද;

(ii) ඉතිරි වන්දි මුදල් ලබාදෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම මාර්ගයෙහි,

(i) සංවර්ධන වැඩකටයුතු ආරම්භ කරන දිනය කවරේද;

(ii) සංවර්ධනය සඳහා වෙන්කළ මුදල කොපමණද;

(iii) පාලම් සංවර්ධනය සඳහා කොපමණ මුදලක් වෙන්කර තිබේද;

(iv) සංවර්ධන කටයුතු අවසන් කළ හැකි දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

578/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.03.03 දින වැලිගම, උඩුපිල පදිංචි අරුණ දේශප්‍රිය මහගමගේ මහතා විසින් අංක CIB/2-138/37 යටතේ වැලිගම පොලීසියේ පැමිණිල්ලක් කර තිබේද;

(ii) එම පැමිණිල්ල විභාගකර තිබේද;

(iii) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2016.01.29 දින උක්ත පැමිණිල්ලට අදාළව, එම්. ඒ. දේශප්‍රිය මහතා විසින් අංක IGP/PAC/O/53/16 යටතේ පොලිස් මූලස්ථානයේ පැමිණිල්ලක්, කර තිබේද;

(ii) එසේ නම්, පොලිස් මූලස්ථානය විසින් එම පැමිණිල්ලට අදාළව පරීක්ෂණයක් සිදුකර තිබේද;

(iii) එසේ නම්, එය විසඳා ඇති ආකාරය කවරේද;

(iv) නොඑසේ නම්, ඒ මන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 ජුනි මස 10 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

105/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා වසර පහක කාලය තුළ යුරෝපා මහාද්වීපයට අයත් රටවල්වලදී මියගිය ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ පදිංචි ලිපිනය හා උක්ත රටවල්වලදී කරන ලද රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින්ගේ මරණ වලට ආසන්නතම හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ යුරෝපා මහාද්වීපයට අයත් රටවල්වලදී පූර්ණ සහ අර්ධ ආබාධිත තත්ත්වයට පත් වූ ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ ලිපිනය හා උක්ත රටවල්හි දී කරන ලද රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින් ආබාධිත වීමට හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

462/'16

ගරු ඊ. සරවනපවන් මහතා,— ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජයේ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය මඟින් ප්‍රජා සංවර්ධන සහකාර තනතුරුවලට ඉල්ලුම්පත් කැඳවීමේදී, ජන අනුපාතය, භාෂා අනුපාතය සහ ප්‍රාදේශීය වශයෙන් ප්‍රමුඛතාවය ලබා නොදුන් බවත්;

(ii) මෙම අමාත්‍යාංශය වසර 30කට වැඩි කාලයක් උතුරු නැගෙනහිර ප්‍රදේශවල ක්‍රියාත්මක නොවීමෙන් එහි පුරප්පාඩු ඇති වූ බවත්;

(iii) (i)හි සඳහන් කරුණු නොසලකමින් දීපව්‍යාප්ත පුරප්පාඩු 205ක් සඳහා වූ තරඟ විභාගයෙන් සිංහල, මුස්ලිම් හා දෙමළ පිළිවෙළින් 189, 15 සහ 01 වශයෙන් අපේක්ෂකයින් තෝරා ගැනීම සම්බන්ධයෙන් දෙමළ ජාතික සන්ධානය පාර්ලිමේන්තුවේදී මතු කළ විරෝධය හේතුවෙන් හිටපු ජනාධිපතිවරයා විසින් එය තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කරන ලද බවත්;

(iv) කෙසේ වුවද, (i)හි කරුණු නොසලකමින් ඉහත (iii)හි පරිදි ප්‍රජා සංවර්ධන සහකාර තනතුරුවලට බඳවාගෙන ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැනට උතුරු නැගෙනහිර පළාත්වල තිබෙන පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ක්‍රියා කරන ආකාරය කවරේද;

(ii) (i)හි කරුණු සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට යහපාලනය තුළ ඔබ අමාත්‍යාංශය කටයුතුකර නොමැති බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම අඩුපාඩුව සම්පූර්ණ කිරීමට කටයුතු කරන්නේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

463/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයස අවුරුදු 65ට වැඩි 1980 ජූලි වැඩවර්ජකයින්ට 2013 ජනවාරි මස සිට රු. 5,000/-ක දීමනාවක් රජයෙන් ගෙවූ බවත්;

(ii) 2015 අයවැය කථාව මඟින් මෙම දීමනාව රු.6,000/- දක්වා වැඩි කිරීමටත්, වයස අවු 63ට වැඩි වර්ජකයින්ට සහ මියගිය වර්ජකයින්ගේ කලත්‍රයින්ටත් එම දීමනාව ලබාදීමටත් යෝජනා කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම දීමනාව නැවැත්වීමට රජය තීරණය කර තිබේද;

(ii) එම දීමනාව වෙනුවට රු.250,000/-ක මුදලක් එක් වරක් පමණක් ලබාදීමට රජය තීරණය කර තිබේද;

(iii) රු.6,000/- බැගින් මාසිකව වියදම් කළහොත්, එකී මුදල ප්‍රමාණවත් වන්නේ දළ වශයෙන් මාස 42කට පමණක් බව පිළිගන්නේද;

(iv) ශ්‍රී ලංකාවේ, අපේක්ෂිත ආයු කාලය වසර 74ක් වන බැවින් මෙම වැඩිහිටි පිරිස ජීවිතයේ ඉදිරි කාලය ජීවත් කරවීම සඳහා රජය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

489/'16

ගරු කනක හේරත් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී අයහපත් කාලගුණික විපර්යාස හේතුවෙන් දේපළ අලාභහානි සිදු වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින්, වන්දි මුදල් ගෙවා ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) වන්දි මුදල් ගෙවීමට ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉතිරි පවුල් සඳහා වන්දි මුදල් ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉදිරියේදී ස්වභාවික උවදුරු මඟින් සිදු වන දේපළ හානි වැළැක්වීම සඳහා රජය ගෙන ඇති පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

495/'16

ගරු නාමල් රාජපක්ෂ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළමැටිය ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් පිළිබඳ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මකවීම තුළින් ධීවර කර්මාන්තය අහිමි වන මාදැල් ධීවර කාර්මිකයින් සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) මාදැල් ධීවර කාර්මිකයින් සඳහා වන්දි ප්‍රදානය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එක් ධීවර කාර්මිකයෙකු සඳහා ගෙවනු ලබන වන්දි මුදල කොපමණද;

(v) ඊට අමතරව, මෙම ධීවර කාර්මිකයින්ගේ ජීවිකාව පවත්වාගෙන යාම සඳහා ධීවර කර්මාන්තයේ නියැලීමට ධීවර යාත්‍රා හා ආම්පන්න ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

496/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරියේ, දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ උපදේශකවරුන්ගේ නම්, ලිපින, පත්වීම් දිනයන් හා අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් එක් උපදේශකවරයෙකු සඳහා ගෙවනු ලබන දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාර්ග සංවර්ධන අධිකාරියේ මහජන සම්බන්ධතා නිලධාරින්ගේ නම්, ලිපින, පත්වීම් දිනයන් හා අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් එක් මහජන සම්බන්ධතා නිලධාරින් සඳහා ගෙවනු ලබන දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අ(i) සහ ආ(i)හි සඳහන් තනතුරු ඇති කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමතිය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, අනුමතිය ලබා ගත් දින කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

499/’16

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කින්නියා අධ්‍යාපන කලාප ගුරු සම්පත් මධ්‍යස්ථානයට අනුයුක්ත කර ඇති පුද්ගලයින්ගේ නම්, ලිපින සහ ගුරු සේවා ශ්‍රේණිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෙම ගුරුවරුන් අනුයුක්ත කිරීම සඳහා යොදා ගත් චක්‍රලේඛය කවරේද;

(iii) ඒ සඳහා අයදුම්පත් කැඳවන ලද දිනය සහ සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන චක්‍රලේඛවලට පටහැනි ආකාරයෙන් මෙම පත්වීම් ලබාදී ඇති බව දන්නේද;

(ii) යහපාලනය යටතේ මෙවැනි අක්‍රමිකතා නැති කිරීම සඳහා නිසි පරිදි අයදුම්පත් කැඳවා සුදුසුකම් ඇති අය පත්කිරීමට හැකි ඉක්මනින් කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

548/’16

ගරු විමල් වීරවංශ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික සංහිඳියාව සඳහා වූ කාර්යසාධක බලකාය නම් වූ ආයතනයක් පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, එය පිහිටුවා ඇත්තේ අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය යටතේද;

(iii) එය පිහිටුවනු ලැබුවේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේදී රජය විසින් පිළිගනු ලැබූ යෝජනාවලිය අනුවද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කාර්යසාධක බලකාය පිහිටුවීමේ අරමුණු සහ එයට පවරා ඇති කාර්යභාරය කවරේදැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත කාර්යසාධක බලකායේ සභාපති හා අනෙකුත් සාමාජිකයින් කවුරුන්ද;

(ii) ඔවුන්ගේ සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම කාර්යසාධක බලකායේ කටයුතු වෙනුවෙන් එහි සභාපති සහ අනෙකුත් සාමාජිකයන් 10 දෙනාට ගෙවනු ලබන දීමනා හා අනෙකුත් වරප්‍රසාද කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, එ මන්ද?

551/’16

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1994 ට පෙර පැවති රජය ලංකා ගමනාගමන මණ්ඩලය ප්‍රවාහන සමාගම් බවට පත් කිරීමේදී සේවක සේවිකාවන්ට එකී සමාගම්වල යම් කොටස් ප්‍රමාණයන් ලබා දුන් බවත්;

(ii) මෙම ප්‍රවාහන සමාගම් 2005 අංක 27 දරන පනතින් නැවතත්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය බවට ස්ථාපිත කළ බවත්;

(iii) එකී පනතේ 33(3) වගන්තිය යටතේ හිටපු ලංගම සේවක සේවිකාවන්ගේ කොටස් නැවතත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට පවරාගත් බවත්;

(iv) එකී 33(3) වගන්තියේ සඳහන් පරිදි කොටස් හිමියන්ට කොටසකට රු. 10/- බැගින් වූ මුදල 2005 වසරේ සිට මේ දක්වා නොගෙවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වන්දි මුදල් ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

569/'16

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ ආරම්භ කර අතරමග නතර කර ඇති අනුරාධපුර මහ රෝහලේ රථගාල ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි වැඩ කටයුතු නැවත ආරම්භ කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා විකල්ප වැඩපිළිවෙළක් හෝ ව්‍යාපෘතියක් තිබේද;

(iv) මේ සඳහා වෙන්ව තිබූ රුපියල් මිලියන දෙකක මුදල අවිච්ඡේද වී ඇති නිසා, එම මුදල නැවත ලබා ගැනීමට කටයුතු කර තිබේද;

(v) නොඑසේ නම්, ඒ සඳහා විකල්ප වැඩපිළිවෙළක් හෝ යෝජනාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

159/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වනජීවී දෙපාර්තමේන්තුවට අයත් වනාන්තර තුළ පයිනස් හා ඉයුකැලිප්ටස් වගා කර ඇති ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් අක්කර කොපමණද;

(ii) මෙම වගාව නිසා පරිසරයට ඇති වාසි හා අවාසි කවරේද;

(iii) පයිනස් හා ඉයුකැලිප්ටස් වගාව නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇති ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පයිනස් හා ඉයුකැලිප්ටස් වෙනුවට දේශීය ශාකයක් වගා කිරීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම ශාක වර්ග කවරේද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී දේශීය ශාක වගා කිරීමට පියවර ගන්නේද; ඒ සඳහා සැලසුම් සකස් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

466/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් නවතා දමන ලද කොළඹ වරාය නගර ව්‍යාපෘතිය යළි ආරම්භ කිරීමට තීරණය කර තිබේද;

(ii) ව්‍යාපෘතිය යළි ආරම්භ කරන දිනය කවරේද;

(iii) පසුගිය රජය විසින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ආයෝජකයින් සමඟ එළැඹ තිබූ ගිවිසුම සහ වත්මන් රජය එළැඹ තිබෙන ගිවිසුම අතර පවතින වෙනස්කම් කවරේද;

(iv) වත්මන් රජය විසින් එළැඹ තිබෙන ගිවිසුම සභාගත කරන්නේද;

(v) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය නැවැත්වීමෙන් පසු නව පාරිසරික බලපෑම් අධ්‍යයනයක් සිදුකර තිබේද;

(ii) එකී පාරිසරික බලපෑම් වාර්තාව සභාගත කරන්නේද;

(iii) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ව්‍යාපෘතිය නවතා තිබුණු කාලයේදී සිදුවූ පාඩුව සඳහා ආයෝජකයින් විසින් යම් වන්දියක් ඉල්ලා තිබේද;

(ii) එසේ නම්, ඉල්ලා ඇති වන්දි මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

497/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෛද්‍ය නිලංග සමරසිංහ මහතා ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ සභාපති ලෙස පත්වූ දිනය කවරේද;

(ii) ඔහු එම ධූරයේ සේවය කරන ලද කාලය කොපමණද;

(iii) ඔහු එම ධූරයෙන් ඉවත් කරනු ලැබුවේද; නැතහොත්, කැමැත්තෙන් ඉල්ලා අස්වූයේද;

(iv) ඔහුට ඇති ජීවිත තර්ජන හේතුවෙන් ඔහු විදේශගත වී ඇති බව දන්නේද;

(v) එම ජීවිත තර්ජන සම්බන්ධයෙන් රජය මඟින් පරීක්ෂණයක් සිදුකර තිබේද;

(vi) එසේ නම්, එහි ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.8/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,— රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩපිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.9/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩපිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.10 /'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සහා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දූරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.11/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඬුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.12/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ1988 සිට 2010 දක්වා වසර 22ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර,

එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.13/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.14/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩසටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.15/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.16/'15

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.17/'15

ගරු බුද්ධික පතිරණ මහතා,—නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,— පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත්

ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.18/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම,— පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.19/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම,— රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.21/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.22/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා ඍජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.23/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.24/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.25/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.26/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.27/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මඟ හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.28/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.29/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.30/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමුපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.31/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට (20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.32/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.33/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.34/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.35/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන පාඨමාලාවන් රැකියාභිමුඛ පාඨමාලාවන් බවට පත්කිරීම,— දිවයිනේ සියලුම රජයේ විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන ශාස්ත්‍රීය අධ්‍යාපනයම සඳහා වූ උපාධි පාඨමාලාවන් රැකියාභිමුඛ වෘත්තීයමය උපාධි පාඨමාලාවන් බවට පරිවර්තනය කර එමගින් බිහිවන්නා වූ උපාධිධාරීන් වෙත නව රැකියා සපයා දීමේ අරමුණ ඇතිව, සියලුම විශ්වවිද්‍යාල සමඟ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.36/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ සඳහා නිසි ප්‍රමිතීන් නියම කිරීම,— දිවයින පුරා පවත්වාගෙන යනු ලබන පාසල් සිසු ප්‍රවාහන සේවාවන් නියමිත ප්‍රමිතියෙන් නොපවතින බැවින් සහ ඇතැම් පාසල් වෑන් රථ සේවකයින්ගේ පැවතුම් යහපත් තත්ත්වයෙන් නොපවතින බැවින්, නිසි ප්‍රමිතියෙන් යුතු වෑන් රථ සේවාවක් පවත්වාගෙන යෑම සඳහාත්, එම සේවාවන් ලබාගන්නා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, වෑන් රථ සේවාවන් සඳහා ප්‍රමිතීන් හඳුන්වාදිය යුතුයැයි ද, වෑන් රථ සේවකයින් තුළ යහපත් පැවතුම් පවත්වාගෙන යාම සඳහා විනය නීති මාලාවක් හඳුන්වා දිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.37/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික සහ ජාත්‍යන්තර අනාගත ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ අනාගත ඉල්ලුමට සරිලන කාර්මික සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන් පිළිබඳව පුරෝකථනයක් කර අදාළ නිෂ්පාදනයන්ට අනුබද්ධිත සියලුම ක්ෂේත්‍රවල අන්තර් සම්බන්ධතාවයක් තුළින් ද, නවීන තාක්ෂණය උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගනිමින් ද, නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.38/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික උරුමයන් රැකගැනීම සඳහා ඩිජිටල් පුස්තකාලයක් ඇති කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කරමින්, පෝෂණය කර අනාගත පරම්පරාව වෙත රැගෙන යාම සඳහා ද, ජාන සම්පත් හා ජෛව උරුමයන් අපහරණය වැළැක්වීම සඳහා පුළුල් ජාතික වැඩපිළිවෙළක් අවශ්‍යව ඇති බැවින් ද, පරිසරය, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය, කෘෂිකර්මාන්තය හා සම්ප්‍රදායික කර්මාන්ත ඇතුළු සියලු ක්ෂේත්‍රයන් සඳහා ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගත් නවීන පුස්තකාලයක් සකස් කිරීමට ද, ඒ සඳහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාංශය, පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ඒකකය ඇතුළු සියලු අංශ ඒකාබද්ධවූ වැඩපිළිවෙළක් සකස් කිරීමට ද පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.39/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම ආරක්ෂා කර ගැනීම සඳහා වූ ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම භාවිතා වන වෛද්‍ය ක්‍රම, කෘෂිකර්මාන්තය, ආහාර සංරක්ෂණය, හස්ත කර්මාන්ත අංශය ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන් නියෝජනය කෙරෙන ජනතාවගෙන් තොරතුරු ලබාගෙන, ජෛව විවිධත්ව ඒකකය, බුද්ධිමය දේපළ කාර්යාංශය ඇතුළු අදාළ අංශ ඒකාබද්ධව ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.40/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට ආවේණික හා ඖෂධමය වටිනාකම්වලින් යුතු ශාඛවල ජාන සම්පත්වලට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම,— විදේශීය රටවල් ශ්‍රී ලංකාවට ආවේණික වටිනා ඖෂධමය ශාඛවල සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් හඳුනා ගෙන, ඒවාට වංචනික ලෙස පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම වැළැක්වීම සඳහා අදාළ සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් සඳහා ශ්‍රී ලංකාවට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමටත්, ඖෂධ නිෂ්පාදනයට සහ වැඩි දියුණු කිරීමට එම කොටස් යොදා ගැනීමටත්, ජෛව විවිධත්ව අංශය, බුද්ධිමය දේපළ කාර්යාංශය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇතුළු වගකිවයුතු සියලු ආයතන එක්ව විශේෂ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.41/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතා නියෝජිතයින්ගේ ගරු නාම අත්හැරීම,— ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු පාර්ලිමේන්තු, පළාත් සභා, ප්‍රාදේශීය සභා නියෝජනය කරන සියලුම ජනතා නියෝජිතයන් මාසිකව තමන් කරන සේවයට අදාළව වැටුප් හා / හෝ දීමනා ලබා ගන්නා අතර ඉහත කිසිදු ධූරයක් නිස්සරණාධ්‍යාසයෙන් සිදු කරනු ලබන ගරු සේවයන් නොවන බැවින් ද, එම ධූර දරන්නන්ගේ නමට ඉදිරියෙන් හෝ ධූරයට ඉදිරියෙන් අතිගරු, ශ්‍රීමත් හෝ ගරු යන නාම සහ නමට පසුව උතුමාණන්, මැතිතුමා යන පද යෙදීම උපහාසයට ලක්වීමට හේතුවක් වී ඇති බැවින් ද, ජනතා නියෝජිතයන්ගේ ගරු නාම භාවිතය නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.42/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීම,— විවිධ පාර්ශ්වයන් විසින් වැඩිහිටි පුරවැසියන් නොසලකා හැරීම තුළින් සිදුවන විවිධ අසාධාරණයන් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශයේ වැඩිහිටි ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.43/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි ප්‍රජාව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායක කර ගැනීමට ණය දීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවට තම ජීවනෝපාය මාර්ග ශක්තිමත් කරගනිමින් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයට දායකවීමට බැංකු පද්ධතිය මගින් ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම ඔවුන්ට සමාජය තුළ වෙනත් අකාරයකට සැලකීමක් වන හෙයින් එම අසාධාරණ තත්ත්වය වැළැක්වීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.44/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති පුද්ගලයින් සමාජය තුළ සක්‍රීය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— සමාජ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා තම ශ්‍රමය කැප කර වයස අවුරුදු 60 ඉක්මවීමෙන් පසු සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැතිව අක්‍රීයව කොන්වී සිටින වැඩිහිටියන්, සමාජයේ සක්‍රීය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පාසල් ප්‍රජාව ඇතුළු මුළු මහත් සමාජයම දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම පුළුල් කිරීම,— ශ්‍රී ලංකාවේ අනාගත තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුමක් ලෙස සහ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන්නාවූ වර්ධනයට සාපේක්ෂව පුහුණු ශ්‍රමිකයින්ගේ අවශ්‍යතාව සපුරා ගැනීමේ අරමුණ ඇතිව පාසල් විෂය නිර්දේශයට මෝටර් කාර්මික ශිල්පය විෂයයක් ලෙස ඇතුළත් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන වර්ධනයට සරිලන ලෙස, එම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින්ගේ ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි, පාසල් මට්ටමින් ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීම,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ රජයේ කාර්මික විද්‍යාල හා අනුබද්ධ ආයතනවල ඉගෙනුම් කටයුතු සිදු කරනු ලබන්නේ වසර 25 - 30ක් තරම් පැරණි විෂය නිර්දේශයක් යටතේ බැවින්, එම තත්ත්වය වෙනස් කිරීම සඳහා එම විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ත්‍රිරෝද රථ හා යතුරු පැදි ආශ්‍රිත රැකියාවල නියුක්ත වූවන්ගේ රැකියාවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ත්‍රිරෝද රථ හා යතුරුපැදි ආශ්‍රිතව ඍජු හා වක්‍ර ලෙස රැකියාවන්හි නියුක්තවීමට කැමැත්තක් දක්වන තරුණ පිරිස හා විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යන ජන කණ්ඩායම්වල ආර්ථික ශක්තිය වර්ධනය කිරීමෙන් සමස්ත ජාතික නිෂ්පාදිතයට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමේ අරමුණ ඇතිව එම ක්ෂේත්‍රයේ නියුක්තවූවන්ගේ සක්‍රීය දායකත්වය ජාතික ආර්ථිකයට එක් කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් කඩිනමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය/දේශීය සූපවේදය පිළිබඳ රට තුළ ජනතා ආකල්ප පුළුල් කිරීම,— ශ්‍රී ලාංකීය/දේශීය ආහාර කලාව පිළිබඳ දේශීය හා විදේශීය ජනතාව තුළ වැඩි නැඹුරුවක් ඇති කිරීමේ අරමුණ ඇතිව, රට තුළ ජනතා ආකල්ප ඒ වෙත යොමු කිරීම සඳහා පාසල්, විශ්වවිද්‍යාල, තෘතීයික අධ්‍යාපන ආයතනවල විෂය පාඨමාලාවට සූපවේදය විෂයයක් ලෙස ඇතුළත් කිරීමටත්, රාජ්‍ය හා පෞද්ගලික අංශවල මැදිහත්වීම මත පර්යේෂණ අංශ දිරිගැන්වීම මගින් නව සොයාගැනීම් සිදු කිරීමටත්, ඒ හා බැඳුනු ආයතන පද්ධතිය සම්බන්ධ කර ගනිමින් සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි, පශ්චාත් උපාධි පාඨමාලා ඇති කිරීම තුළින් මෙම ක්ෂේත්‍රය පිළිබඳ ජනතාව තුළ පුළුල් ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.50/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ ආහාර සංස්කෘතිය ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලාංකීය ආහාර කලාව, රස කාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සකස්වී ඇති අතර ඒ හා බැඳුණු ශ්‍රී ලාංකීය ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මෙන්ම දේශීය හා විදේශීය ජනතාව අතර අපගේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීම මගින් ශ්‍රී ලාංකීය අනන්‍යතාව අන්තර්ජාතිකව ඔසවා තැබීම සඳහා වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන්ගේ පර්යේෂණ නිබන්ධන අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කර සකස් කිරීම,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන් විසින් තම පාඨමාලා සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධන රටේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා සංවර්ධන කටයුතුවලට උපයෝගී කර ගැනීම වැදගත් වන බැවින් එම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරු හා පර්යේෂණ නිබන්ධන අදාළ වන අමාත්‍යාංශ අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා එකී අමාත්‍යාංශයේ නිලධාරියෙකු පත්කිරීමෙන් එම පර්යේෂණ නිබන්ධන මගින් අමාත්‍යාංශයේ ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සහ කාලීන ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.52/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 18 සම්පූර්ණ වන අවස්ථාවේදීම ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් කිරීම,— මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව ඡන්ද හිමි නාමලේඛන සංශෝධනය කිරීමට නියමිත දිනට පසුව හෝ පෙර දිනකදී වයස අවුරුදු 18 සම්පූර්ණ වන තැනැත්තන්ට නියමිත වයස සම්පූර්ණ වූ දිනටම ඡන්ද හිමි නාමලේඛනයෙහි නම ඇතුළත් කරවා ගත හැකි ආකාරයේ ප්‍රායෝගික වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.53/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව සේලයින් විශාල ප්‍රමාණයක් භාවිතා කරනු ලබන අතර සේලයින් ආනයනය කිරීම සඳහා ද විශාල මුදලක් වාර්ෂිකව විදේශීය රටවලට ඇදී යන බැවින්, එම විදේශ විනිමය ප්‍රමාණය රට තුළ ඉතිරි කර ගැනීමේ අරමුණ ඇතිව ලංකාව තුළ පවත්නා දේශීය තාක්ෂණය යොදාගෙන සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා රාජ්‍ය, පෞද්ගලික හෝ සමුපකාර අංශයන් සම්බන්ධ කර ගනිමින් ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය මැදිහත් වීමෙන් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.54/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව විශාල ප්‍රමාණයක පොල් වතුර අපතේ යන බැවින්, නව තාක්ෂණය යොදා ගනිමින් විධිමත් ක්‍රමවේදයක් යටතේ පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.55/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සාගරයේ නව සම්පත් ගවේෂණය,— විශාල සාගර කලාපයක් හිමි රටක් වූ ශ්‍රී ලංකාව ප්‍රමුඛත්වය ලබා දී ඇත්තේ ධීවර කර්මාන්තය සඳහා පමණක් වන අතර සාගරය ආශ්‍රිතව විශාල ප්‍රමාණයක සවභාවික සම්පත් ඇති බැවින් මෙරටට විශාල රැකියා අවස්ථා ප්‍රමාණයක් මෙන්ම ධනයක් ද උපයා ගැනීමේ අරමුණ ඇතිව සාගර සම්පත් පිළිබඳව විධිමත් වැඩිදුර අධ්‍යයනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.56/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ මත්ස්‍ය සම්පත විදේශිකයින් විසින් නෙලා ගැනීම වළකාලීම,— ශ්‍රී ලාංකික ධීවරයන්ට විශාල ආර්ථික අවාසියක් ඇති කරමින් ශ්‍රී ලංකා මුහුදු කලාපයේ මත්ස්‍ය සම්පත් විදේශිකයින් විසින් නෙලා ගන්නා බැවින් ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ මාළු ඇල්ලීමට සහ විදේශ යාත්‍රාවලට මාළු බෑම සඳහා තොටුපලක් ලෙස භාවිතා කිරීම වළකාලීම සඳහා රජය විසින් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කොස් නිෂ්පාදනය වැඩි කර ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම,— ඉතා ප්‍රනීත මෙන්ම ඖෂධීය ගුණයෙන් අනූන, රසායනික ද්‍රව්‍යවලින් තොරව වගා කළ හැකි බෝගයක් වන කොස් වගාව ව්‍යාප්ත කිරීම තුළින් ඒ ආශ්‍රිත නිෂ්පාදන ඉහළ නංවා ඒවා අපනයනය කිරීම මගින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අප රටට උපයා ගත හැකි බැවින් ඒ සඳහා රජයේ මැදිහත්විමෙන් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.58/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ගොවි සම්මාන උළෙලක් වාර්ෂිකව සංවිධානය කිරීම,— රටක් පෙරට යාමට නම් මූලික වශයෙන් ගොවිතැනින් සශ්‍රීක විය යුතු බැවින් රට සරු කරන ගොවි ජනතාවට සිය වෘත්තිය පිළිබඳ අභිමානයක් ඇතිවන පරිදි විධිමත් සංවිධාන ව්‍යුහයක් හරහා ක්‍රියාත්මක වන ගොවි සම්මාන උළෙලක් රජයේ මැදිහත්වීමෙන් වාර්ෂිකව සංවිධානය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සහන මිලකට LED බල්බ පාරිභෝගික ජනතාවට ලබාදීම,— නිවාස ආලෝක කිරීමට යොදා ගන්නා ගුණාත්මක LED බල්බ මිල අධික බැවින්, විදුලිබල මණ්ඩලය මැදිහත්වී සහනදායි මිලකට හා ගෙවීමේ ක්‍රමයට මෙම බල්බ පාරිභෝගික ජනතාවට ලබාදී ජාතික වශයෙන් විදුලිය විශාල ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමටත්, LED බල්බ ජනතාව අතර ජනප්‍රිය කිරීම මගින් විදුලිබල මණ්ඩලයටද අමතර ආදායමක් උපයා ගැනීමටත් හැකිවන පරිදි ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැකසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සුළු පරිමාණ සෙල්ලම් බඩු කර්මාන්තශාලා ව්‍යාප්ත කිරීම,— ශ්‍රී ලංකාව තුළ සෙල්ලම් බඩු සඳහා විශාල වෙළඳපොළක් පැවතුණ ද, රට තුළ ඒවා නිෂ්පාදනය කෙරෙන්නේ සුළු වශයෙන් වන අතර ඒ සඳහා චීනය ප්‍රමුඛ අනෙකුත් රටවලට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ඇදී යන බැවින්, සුළු පිරිවැයක් දැරිය යුතු මෙම කර්මාන්තය ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යාප්ත කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.61/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදනය දැනට ඉතා අවම මට්ටමක පවතින අතර ඖෂධ ආනයනය සඳහා වසරකට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැයවන බැවින් දියුණු මානව සම්පතක් හිමි රටක් ලෙස ශ්‍රී ලංකාවට අත්‍යාවශ්‍ය ඖෂධ වර්ග රට තුළම නිපදවීමට අවශ්‍ය පහසුකම් රජය මැදිහත් වීමෙන් ලබා දී ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් විෂය නිර්දේශයට මනෝ විද්‍යාව විෂයය ඇතුළත් කිරීම,— පාසල් ශිෂ්‍ය ප්‍රජාව නිරෝගී මනසකින් යුත් බුද්ධිමත් තීරණ ගැනීමට හැකි පිරිසක් ලෙස හැඩගැස්වීම උදෙසා හය වැනි ශ්‍රේණියේ සිට ක්‍රියාත්මක වන පරිදි බෞද්ධ මනෝ විද්‍යාව සහ බටහිර මනෝ විද්‍යාව යන විෂයයන් ඒකාබද්ධ කොට ක්‍රමවත්ව සැලසුම් කරන ලද "මනෝ විද්‍යාව සහ භාවනාව" නමින් විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවීම,— විශ්‍රාමිකයන් වෙනුවෙන් උපදේශන සේවා, වෛද්‍ය පහසුකම් සහ දිවා සුරැකුම් සේවා යනාදී වැඩිහිටියන්ට අවශ්‍ය සුබසාධන කටයුතු රැසක් එකම ස්ථානයකින් ඉටු කර ගැනීමට හැකි වන පරිදි විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන ගොඩනැංවීමටත්, එම මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගනිමින් යම් නිෂ්පාදන කටයුත්තක් සඳහා විශ්‍රාමිකයන් යොමු කිරීම හරහා ඔවුන්ගේ දිවියට සහනයක් ලබාදෙන අතර අමතර ආදායමක් ද උපයා ගැනීමට හැකි වන ලෙස රජය මැදිහත් වීමෙන් රටපුරා විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමිකයන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා නව ලොතරැයියක් හඳුන්වා දීම,— විශ්‍රාමික රාජ්‍ය සේවකයන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීමට සහ ඔවුන්ගේ සුබසාධන කටයුතු සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීම සඳහා නව ලොතරැයියක් වෙළඳපොළට හඳුන්වාදීමට රජය කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.65/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක මගපෙන්වන්නන් පුහුණු කිරීම,— සංචාරකයින්ට ඵලදායී හා ආචාරශීලී සේවාවක් සැපයීමට හැකි පිරිසක් බවට පත් කිරීමට මෙන්ම, ඔවුන්ගේ වෘත්තීය මට්ටම ඉහළ නැංවීම සඳහාත් සංචාරක මගපෙන්වන්නන් පුහුණු කිරීමට විධිමත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.66/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉඩම් සම්බන්ධව පවතින නීති සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාව තුළ මේ වන විට ඉඩම්වලට ව්‍යාජ ඔප්පු සකසා විකිණීමේ ජාවාරමක් ක්‍රියාත්මකවන අතර මීට අදාළව නීතිය ක්‍රියාත්මක වීම ද ඉතා අවම මට්ටමක පවතින බැවින්, ඉඩම් අයිතිය සම්බන්ධව සුරක්ෂිතභාවය වැඩි වන අයුරින් හා වැරදිකරුවන්ට දැඩි දඬුවම් පැමිණවිය හැකි අයුරින් පවතින නීති පද්ධතිය සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.67/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව අවට සාගරයේ කොරල්පර ආරක්ෂා කර ගැනීම,— ශ්‍රී ලංකාව අවට සාගරයේ ඇති කොරල්පර මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශවීමේ තර්ජනයට මුහුණපා ඇති බැවින්, එම කොරල්පර ආරක්ෂාකර ගැනීම සඳහා මිනිස් ක්‍රියාකාරකම් පාලනය කිරීමට හැකිවන පරිදි පුද්ගල ආකල්පමය වෙනසක් මෙන්ම, නෛතික රාමුවේ වෙනසක් ඇති කිරීම සඳහා විද්වත් කමිටුවක් හරහා සුදුසු වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.68/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් වෑන් රථ සඳහා කාන්තාවන් සේවයට යෙදවීම,— පාසල් වෑන් රථ සේවයෙහි ගුණාත්මක බව වැඩි කිරීමටත්, එම වෑන් රථවල ගමන් කරන දරුවන්ගේ ආරක්ෂාව උදෙසාත් සියලුම පාසල් සේවා වෑන් රථවල සේවය සඳහා කාන්තාවන් යොදා ගැනීම අනිවාර්ය කිරීමට නීති සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.69/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඖෂධ මිල පහත හෙළීම,— ශ්‍රී ලංකාව තුළ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කර ඖෂධීය නාමයෙන් බෙහෙත් අලෙවි කිරීම කඩිනමින් ආරම්භ කිරීම මගින් ඖෂධ මිල පහත හෙළීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.70/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය හරහා අලෙවි කරන ඖෂධ ඇතුළු ජාවාරම් මැඩපැවැත්වීම,— මේ වන විට අන්තර්ජාලය හරහා ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවන්‍ය නිෂ්පාදන විශාල ලෙස අලෙවි කෙරෙන අතර මෙම ජාවාරම් අප රටේ ජනතාවගේ සෞඛ්‍යයට සහ යහපැවැත්මට විශාල තර්ජනයක් වන බැවින් ඒවා මැඩපැවැත්වීම සඳහා නිසි වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.71/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතා නොකර වගා කිරීම,— අධික විෂ සහිත කෘෂි රසායන ද්‍රව්‍ය ශ්‍රී ලංකාව තුළ තහනම් කර පැරණි ක්‍රමයට පරිසර හිතකාමී වගා ක්‍රමයක් රටට හඳුන්වාදීමට අවශ්‍ය පර්යේෂණ සිදුකිරීමට කෘෂි විද්‍යාඥයන් හා පරිසරවේදීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඔවුන්ගෙන් ලබා ගන්නා නිර්දේශ තුළින් ජනතාවට වස විසෙන් තොර සෞඛ්‍යාරක්ෂිත ආහාර වේලක් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත්වීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.72/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමෙන් මුදවා ගැනීම,— මේ වන විට ශ්‍රී ලංකාව තුළ පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමේ වැඩි ප්‍රවණතාවයක් නිර්මාණය වී ඇති බැවින් පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලින් මුදවාගැනීම සඳහා රජය මැදිහත්වී විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.73/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඵලදායීතා කමිටුවක් පත් කිරීම,— රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඵලදායීතා වැඩසටහන්හිදී තම ආයතන ඉතා ඉහළ ඵලදායීතා මට්ටමක් කරා මෙහෙයවූ ආයතන ප්‍රධානීන් හඳුනාගෙන ඔවුන්ගේ දැනුම හා අත්දැකීම් ප්‍රයෝජනයට ගත හැකි වන ආකාරයෙන්, එම ආයතනවල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ක්‍රමවේද අනෙකුත් ආයතනවලට ගැලපෙන පරිදි ආදේශ කිරීමට හැකිවන පරිදි එම ආයතන ප්‍රධානීන්ගෙන් සමන්විත ජාතික ඵලදායීතා කමිටුවක් පිහිටවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.74/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රජා වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීම,— සෞඛ්‍ය සේවාවේ අත්‍යාවශ්‍ය අංගයක් වන ප්‍රජා වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ අංශය දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා එම ක්ෂේත්‍රයේ දැනට පවතින ගැටලු නිරීක්ෂණය කර කඩිනමින් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.75/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉංග්‍රීසීන් රාජද්‍රෝහීන් ලෙස නම් කළ ශ්‍රී ලාංකිකයින් ජාතික වීරයන් ලෙස නම් කිරීම,— වර්ෂ 1815 සිට 1948 නිදහස ලැබීම දක්වා වූ කාලය තුළ ඉංග්‍රීසීන්ට එරෙහිව රට ජාතිය වෙනුවෙන් දිවි නොතකා සටන් කළ ශ්‍රී ලාංකිකයින් රාජ ද්‍රෝහීන් ලෙස නම් කර ඇති අතර ඔවුන් සියලුදෙනාම විශේෂ ගැසට් පත්‍රයක් මගින් ජාතික වීරයන් ලෙස නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.76/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිභෝජනයට නුසුදුසු ආහාර වෙළඳ පොළට ඒම වැළැක්වීමට කටයුතු කිරීම,— පරිභෝජනයට නුසුදුසු ආහාර නිෂ්පාදනය කරන, අලෙවි කරන හා ඊට අනුබල දෙන පුද්ගලයන් හා ආයතන වැටලීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ විශේෂ වැටලීම් ඒකකයට පවතින ගැටලු නිරාකරණය කර අවශ්‍ය පහසුකම් නොඅඩුව ලබා දීමටත්, වැරදිකරුවන්ට උපරිම දඬුවම් ලබා දිය හැකි වන පරිදි පවතින නීති පද්ධතිය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වස විස නැති ආහාර නිෂ්පාදනය දිරිමත් කිරීම,— ආහාර හා සම්බන්ධ නිෂ්පාදන කටයුතුවල දේශීයව නිරතව සිටින නිෂ්පාදකයින් ඉලක්ක කර ගනිමින් ගුණාත්මක බවින් ඉහළ, සෞඛ්‍යාරක්ෂිත ආහාර පාරිභෝගිකයන්ට ලබා දීම තුළින් රටට කළ හැකි සේවාව පිළිබඳව දැනුවත් කර, ආකල්පමය වෙනසක් ඇති කිරීමට හා එලෙස වස විසෙන් තොර ආහාර නිපදවන ව්‍යවසායකයින්ට ගෞරව නාමයක් සහිත සම්මාන ප්‍රදානය කොට ඔවුන් දිරිගැන්වීමට වැඩසටහනක් රජය මැදිහත්වී ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.78/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අයථා ලෙස අත්පත් කරගත් අභයභූමිවලට අයත් ඉඩම් නිදහස් කරගැනීම,— ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කර ඇති අභයභූමිවලට අයත් ඉඩම් විවිධ පුද්ගලයින් හා සංවිධාන විසින් නීති විරෝධී ලෙස අත්පත් කරගෙන ඇති බැවින්, එම ඉඩම් නැවත ලබා ගැනීමට රජය කඩිනමින් මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.79/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආදිවාසී ජනයා නගාසිටුවීම සඳහා සැලසුමක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට වාසය කරන ආදිවාසී ජනතාව පිළිබඳ වෙනම සංගණනයක් සිදුකර, ඔවුනට ජීවත් වීම සඳහා දැනට පවතින අපහසුතා ක්‍රමවත්ව හඳුනාගෙන, ඔවුනට ගෞරවනීයව ජීවත් වීමට හැකි පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය සාධනීය සැලසුමක් ආදිවාසී නායකයින් ද ඇතුළත්ව පත්කරන ලද විද්වත් මණ්ඩලයක් හරහා ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි හානි වූ පුරාවස්තු සංරක්ෂණය කිරීම,— තිස් වසරක යුද්ධය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත් වල පැවති පුරාවස්තු විශාල ලෙස විනාශ වූ අතර පවතින පුරාවස්තු පිළිබඳ සමීක්ෂණයක් සිදු කර තොරතුරු රැස්කර ගැනීමත්, එම පුරාවස්තු තහවුරු කිරීම, ආරක්ෂා කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීමත් අරමුණු කර ගෙන විද්වත් පුරාවිද්‍යාඥයින්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.81/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වගා කිරීම සඳහා දේශීය බීජ ප්‍රචලිත කිරීම,— කෘෂි රසායන භාවිතයෙන් තොරව දේශීය කාබනික පොහොර ආශ්‍රයෙන් වගා කළ හැකි දේශීය බීජ වර්ග හඳුනාගෙන එම බීජ කඩිනමින් රට පුරා ව්‍යාප්ත කර රසායනික වස විසෙන් තොර ආහාර ජනතාවට ලබා දීම සඳහා අවශ්‍ය කරන පර්යේෂණ, තාක්ෂණය හා නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.82/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ භාෂා අධ්‍යයනයට පහසුකම් සැපයීම,— පුද්ගල බුද්ධියේ පෘථුල බව තීරණය වීමට ඔහු සතු භාෂා ඥානය ප්‍රධාන සාධකයක් වන බැවින් ඉංග්‍රීසි භාෂාව හැරුණුකොට අනෙකුත් ප්‍රධාන විදේශ භාෂා හැදෑරීමට අවශ්‍ය පහසුකම් පුළුල් කර, සැලසුම් සම්පාදනය කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.83/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා වියදම් කරන මුදල් සීමා කිරීම,— ශ්‍රී ලංකාව තුළ පැවැත්වෙන සියලු මැතිවරණයන්හිදී ඇතැම් අපේක්ෂකයන් අති විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරන අතර මුදල් වියදම් කළ නොහැකි, එහෙත් රටට වැඩක් කළ හැකි බුද්ධිමත් පිරිසකට ඉන් අවාසි සහගත තත්ත්වයක් ඇති වන බැවින් මැතිවරණ සඳහා වියදම් කරන මුදල් ප්‍රමාණය සීමා කිරීමට හැකි වන ආකාරයේ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.84/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යටත් විජිත සමයේ ශ්‍රී ලංකාවෙන් රැගෙන ගිය පුරාවස්තු නැවත ලබා ගැනීම,— ශ්‍රී ලංකාව යටත් විජිතයක්ව පැවති සමයේ අප රටින් පෘතුගාලය, ඕලන්දය හා මහා බ්‍රිතාන්‍යයට රැගෙන ගිය පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත භාණ්ඩ පිළිබඳ සමීක්ෂණයක් සිදු කර එම භාණ්ඩ නැවත අප රටට ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.85/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංඝාධිකරණයක් ස්ථාපනය කිරීම,— භික්ෂූන් වහන්සේලාගේ ආරක්ෂාව හා ගෞරවය රැක ගැනීම වෙනුවෙන් උන්වහන්සේලාට අදාළ අධිකරණමය කාර්යයන් සඳහා වෙනම සංඝාධිකරණයක් පිහිටුවිය යුතු බවටත් එම අධිකරණ තීන්දු සඳහා නීතිමය බලය ලබාගැනීමට හැකි වන අයුරින් මෙම සංඝාධිකරණය ස්ථාපනය කළ යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.86/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ව්‍යවස්ථාපිත සංඝ සභාවක් පත් කිරීම,— පාර්ලිමේන්තුව ඇතුළු ජනතා නියෝජිත ආයතන සඳහා උපදේශකත්වය හා මග පෙන්වීම ලබා දීමට හා අණපනත්වලට සංශෝධන ඉදිරිපත් කළ හැකි නෛතික බලය සහිත සංඝ සම්මුතියෙන් පත් කර ගත් රාජ්‍ය පරිපාලනය, නීතිය, විදේශ කටයුතු හා සමාජ ක්‍රියාකාරකම් පිළිබඳ හසල දැනුමක් සහ අත්දැකීම් සහිත විද්වත් සංඝයා වහන්සේලාගෙන් සමන්විත ව්‍යවස්ථාපිත සංඝ සභාවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වාපි සංස්කෘතික අධ්‍යයන ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලංකාවේ පැවැති ජල තාක්ෂණය හා වැව් තාක්ෂණය නැවත පණගන්වා රැකගැනීම සහ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සිදු කිරීමට හා අධ්‍යාපන පාඨමාලා මගින් උක්ත විෂය ගැන දැනුමින් සන්නද්ධ කරන ලද පිරිසක් නිර්මාණය කිරීමට හැකියාව ඇතිවන පරිදි "වාපි සංස්කෘතික අධ්‍යයන ආයතනය" නමින් ආයතනයක් රජය මැදිහත්වීමෙන් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.88/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මහාවංශය අධ්‍යයනය සඳහා ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලාංකීය ඉතිහාසයේ ගමන් මග පෙන්වන මහාවංශය අධ්‍යයනය කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීමෙන් "මහාවංශ අධ්‍යයන පර්යේෂණ ජාතික ආයතනය" නමින් ආයතනයක් රාජ්‍ය අනුග්‍රහයෙන් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.89/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ විරෝධී ක්‍රියා නැවැත්වීම,— ධර්ම ග්‍රන්ථ හා ප්‍රකාශන අධ්‍යයනය කිරීමේ මනා දැනුමක් ඇති නෛතික බලයක් සහිත විද්වත් සංඝ මණ්ඩලයක් පිහිටුවීම මගින් යම් නිර්මාණයක් එළිදැක්වීමට පෙර එය එම මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, සමාජගත කිරීමට නුසුදුසු නම්, සංශෝධන ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි යාන්ත්‍රණයක් සැකසීම මගින් බෞද්ධ විරෝධී ක්‍රියා හා ප්‍රකාශන රචනා වීම හා බුදු දහම සම්බන්ධ කරමින් සාවද්‍ය නිර්වචන ඉස්මතුවීම නැවැත්වීම සඳහා රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.90/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශ හිතෛෂී කලා නිර්මාණ ඇගයීම,— දේශානුරාගය හා ආත්මාභිමානය ඇතිවන පරිදි දේශීය හා සංස්කෘතික වටිනාකමින් අනූන කලාකෘති වාර්ෂිකව ඇගයීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.91/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විනය නැංවීමට කටයුතු කිරීම,— ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සෞඛ්‍ය සම්පන්න, නිරෝගී හා කායිකව ශක්තිමත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමේ අරමුණින් ඔවුන්ට තමා කැමති ක්‍රීඩාවකට යොමු වීමට සහ ප්‍රායෝගික විනය පුහුණුවකට යොමු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.92/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති බෞද්ධාගමික ස්ථාන, ඒ හා සබැඳි අනුෂංගික අංශයන් මෙන්ම, භික්ෂූන් වහන්සේලා පිළිබඳ තොරතුරු ආදී කරුණු එක් රැස් කර විධිමත්ව පරිගණක ගත කර, නවීන තාක්ෂණික උපකරණ සහ ප්‍රමාණවත් මානව හා භෞතික සම්පත් වලින් පිරිපුන් "බෞද්ධ සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථානය" නමින් ආයතනයක් රාජ්‍ය අනුග්‍රහයෙන් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.93/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දහම් පාසල් පාඨ ග්‍රන්ථ කාලානුරූපීව සංශෝධනය කිරීම,— විභාග ඉලක්ක කරගත්, දැනුම පමණක් කේන්ද්‍රගත කළ පාඨ ග්‍රන්ථ වෙනුවට ප්‍රායෝගික පුහුණුව පදනම් කරගත්, බුද්ධිය වර්ධනය කරන්නාවූ, ශිෂ්ට සම්පන්න සමාජයක් නිර්මාණය කිරීම ඉලක්ක කර ගත් පාඨ ග්‍රන්ථ විද්වත් මණ්ඩලයක් හරහා සම්පාදනය කර දහම් පාසල් වෙත ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.94/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාත්‍යන්තර පාසල් නියාමනයට මණ්ඩලයක් පත් කිරීම,— ශ්‍රී ලංකාවේ සංස්කෘතියට, සදාචාරයට හා සමාජ පැවැත්මට ගැලපෙන පරිදි ජාත්‍යන්තර පාසල්හි විෂය පථයන් අවශ්‍ය පරිදි නියාමනය කළ හැකි පූර්ණ බලතල සහිත මණ්ඩලයක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.95/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වඩාත් සක්‍රීය කිරීම,— දේශීය ඉතිහාස දැනුම, සාරධර්ම සම්පන්න බව, නිෂ්පාදන ශක්‍යතාව, බුද්ධි සම්පන්න බව, සම්ප්‍රදායික දැනුම, දේශානුරාගය, නිරෝගීතාව, කුසලතා පූර්ණ බව සහ ආකල්ප සම්පත්තියෙන් යුතු බව යන අංගයන්ගෙන් පරිපූර්ණ සාර්ථක පුරවැසියෙකු බිහි කල හැකි වන පරිදි සකසන ලද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් හරහා සමස්ත අධ්‍යාපන ක්‍රමයේම පරිවර්තනයක් ඇති කිරීමට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වඩාත් සක්‍රීය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.96/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පවුල් වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීම,— සෞඛ්‍ය සේවාවේ අත්‍යාවශ්‍ය අංශයක් වන පවුල් වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ ක්ෂේත්‍රය තුළ දැනට පවතින ගැටලු නිරීක්ෂණය කර ඒවා කඩිනමින් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමටත් එම පවුල් වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීමට සැලසුම් කිරීමටත් රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.97/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සේවය විදේශයන්ට ලබා දීම,— ආයුර්වේද වෛද්‍ය උපාධිය සම්පූර්ණ කරන උපාධිධාරීන්හට විදේශ රටවල රැකියා අවස්ථා ලබා දීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.98/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආයුර්වේද වෛද්‍ය පනත සංශෝධනය කිරීම,— දැනට පවතින යල් පැන ගිය ආයුර්වේද වෛද්‍ය පනත සංශෝධනය කර ආයුර්වේද වෛද්‍යවරුන්ගේ වෘත්තීය ගැටලු විසඳමින්, එම වෘත්තිය සතු ගරුත්වය හා අභිමානය රැක ගැනීමට නව ආයුර්වේද වෛද්‍ය පනතක් කඩිනමින් ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.99/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දුම්රිය ආරක්ෂක පද්ධතියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ දුම්රිය ආරක්ෂක පද්ධති නිර්මාණය කළ නව නිපැයුම් කරුවන් ද, එම ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන් ද, දුම්රිය දෙපාර්තමේන්තුවේ සියලුම ක්ෂේත්‍රයන්හි ප්‍රවීනයන්ගෙන් ද සමන්විත කමිටුවක් මගින් දුම්රිය ආරක්ෂක පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.100/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මගී ප්‍රවාහන සේවයේ ගුණාත්මක තත්ත්වය වැඩි කිරීම,— බස් මගී ප්‍රවාහන සේවයේ ගුණාත්මක තත්ත්වය වැඩි කිරීම මගින් වාර්ෂිකව එම සේවාව ප්‍රතික්ෂේප කරන 1% - 2% ක් පමණ වූ මගීන් ප්‍රමාණය රඳවා ගැනීමට කටයුතු කිරීමෙන්, එම සේවයේ පැවැත්මට දීර්ඝ කාලීනව ඇති විය හැකි අවදානම අඩු කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.101/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සිංහල භාෂාවට සම්මතයක් සකස් කිරීම,— සිංහල භාෂාවේ ලිඛිත ව්‍යවහාරය හා කථන ව්‍යවහාරය දෙයාකාරයක් ගන්නා අතරම න, ණ, ල, ළ භේදය, අල්පප්‍රාණ, මහප්‍රාණ අක්ෂර යෙදීම සහ පද බෙදීම ආදිය ද විවාද සහිත බැවින් සිංහල භාෂාව සඳහා සම්මතයක් සකස් කිරීමට විද්වත් මණ්ඩලයක් පත් කර කාලානුරූපව සිදුවන වෙනස්කම් ද සැලකිල්ලට ගෙන භාෂාවේ පැවැත්ම තහවුරු කිරීමට හැකි ක්‍රියාදාමයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.102/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංස්ථානික කාබනික අපද්‍රව්‍ය මගින් පරිසරය දූෂණය වීම පාලනය කිරීම,— පලිබෝධ නාශක සහ කර්මාන්ත ක්‍රියාවලියන්හි දී පිටවන සංස්ථානික කාබනික අපද්‍රව්‍ය (Persistent Organic Pollutants - POPs) දොළොස් වර්ගයක දූෂණ කාරකයන්ගෙන් සමන්විත අතර ඒවා මිනිසාගේ සෞඛ්‍යයට ඉතා අහිතකර බැවින් එම රසායනිකයන් පරිසරයට මුදා හැරීම පාලනය කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.103/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පාලනයට සම්බුද්ධ දර්ශනය සම්බන්ධ කර ගැනීම,— සප්ත අපරිහානීය ධර්ම, දසරාජ ධර්ම, රාජෝවාද ජාතකය, කුරු ධර්ම ජාතකය, ගන්ඩ තින්දුක ජාතකය, තෙසකුර ජාතකය, දේවධර්ම ජාතකය, සතර සංග්‍රහ වස්තු, චක්කවත්ති සීහනාද සූත්‍රය හා ධර්ම ප්‍රදීපිකාව යන සම්බුද්ධ ඉගැන්වීම් සම්බන්ධව පාර්ලිමේන්තු, පළාත් සභා හා ප්‍රාදේශීය මට්ටමේ සිටින සියලුම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම තුළින් ඔවුන්ගේ භූමිකාව රටේ යහපාලනයට දායක කර ගැනීමට හැකි වන ආකාරයේ වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.104/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම,— ෆ්ලොරසන්ට් බල්බ, දුරකථන, ජංගම දුරකථන, විදුලි උපකරණ, බැටරි, පරිගණක හා එහි කොටස් ආදිය අපද්‍රව්‍ය ලෙස පරිසරයට බැහැර කිරීමේදී ආසනික්, කැඩ්මියම්, රසදිය, ලෙඩ් වැනි බැර ලෝහ පරිසරයට එකතුවන බැවින් මෙම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කර පරිසරය සුරැකීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.105/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ යහපාලනය ස්ථාපිත කිරීම,— අයහපත් පාලනයේ අංග ලක්ෂණ වන අත්තනෝමතික ප්‍රතිපත්ති සම්පාදනය, නිලබල වාදය, බලාත්මක නොවන සහ අසාධාරණ නීති, විධායක බලතල අනිසි පරිහරණය, දේශපාලනයට පුරවැසි දායකත්වය අඩුවීම සහ දූෂණය පැතිරීම යන කරුණු අප රට තුළ නොඅඩුව දක්නට ලැබෙන අතර මේ නිසා රටේ අයහපත් පාලනයක් පවතින බව පෙනී යන හෙයින් රට තුළ යහපාලනය ගොඩනැගීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.106/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රටවල ඇති ශ්‍රී ලංකාවට අයත් පුස්කොළ පොත් නැවත ලබා ගැනීම,— ශ්‍රී ලංකාවට අයත් වටිනා පුස්කොළ පොත් රාශියක් යුරෝපා රටවල් ඇතුළු ලෝකයේ රටවල් ගණනාවක තිබෙන අතර ඒවායේ අන්තර්ගතව ඇති දැනුම මේ වන විට වත්මන් ලාංකීය සමාජයට අහිමිව ගොස් ඇති බැවින්, එම පුස්කොළ පොත් අප රටට ආපසු ලබා ගෙන ඒවායේ අඩංගු පෞරාණික දැනුම නැවත සමාජගත කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.107/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජෛව විවිධත්වය රැක ගැනීම සඳහා කෘෂිකර්මය දායක කර ගැනීම,— ඒක බෝග වගාව වෙනුවට බහු බෝග වගාව සහ මිශ්‍ර බෝග වගාව ජනප්‍රිය කරවීම, ජෛව විවිධත්වයට හානිකර රසායන ද්‍රව්‍ය කෘෂි කර්මාන්තයෙන් ඈත් කිරීම හා ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ ක්‍රම භාවිතය තුළින් රට තුළ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට ගොවීන් යොමු කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතාවගේ ආහාර ලැබීමේ අයිතිය සුරක්ෂිත කිරීම,— එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව අයිතිවාසිකම් පද්ධතීන්ට අනුකූලව ආහාර ලැබීමේ මූලික අයිතිවාසිකම ශ්‍රී ලාංකික ජනතාවට අහිමි වන තත්ත්වයක් රජයේ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම් තුළ දක්නට ලැබෙන හෙයින් උක්ත ප්‍රඥප්තීන්ට අනුව රටේ ජනතාවගේ ආහාර ප්‍රශ්නය විසඳීමේ වගකීම මුළුමනින්ම රජයට පැවරී ඇති බැවින් රජය මැදිහත්වී ආහාර ද්‍රව්‍ය මිල පාලනය හා සෞඛ්‍ය ආරක්ෂිත ආහාර වේලක් රටේ ජනතාවට ලැබීම සහතික කෙරෙන විධිමත් වැඩ පිළිවෙළක් සම්පාදනය කර ජනතාවගේ ආහාර ලැබීමේ මූලික අයිතිවාසිකම තහවුරු කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අකාබනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීම,— අකාබනික ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමත්, අකාබනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීමත්, භාවිතයෙන් ඉවත්වන අකාබනික ද්‍රව්‍ය එකතු කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම හා අකාබනික ද්‍රව්‍ය භාවිතා කිරීමේ පරිසර නීති රීති විධිමත් කිරීමත් තුළින් රටේ පරිසර පද්ධතියේ ආරක්ෂාව හා යහපැවැත්ම සඳහා අකාබනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය ඖෂධ සහ අත් බෙහෙත් පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම,— නිරෝගී ජාතියක් ගොඩනැගීම සහ දේශීය ආයුර්වේදයේ යහපැවැත්ම මූලික අරමුණු වශයෙන් ගෙන දේශීය ඖෂධ වර්ග හා අත් බෙහෙත් පිළිබඳ විධිමත් කරුණු සහිත විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම මගින් දේශීය ඖෂධ සහ අත් බෙහෙත් පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මාතෘ හා ළමා මන්දපෝෂණය තුරන් කිරීම,— ශ්‍රී ලංකාව තුළ අඩුබර දරු උපත් අනුපාතිකය 25% තරම් ඉහළ අගයක් ගන්නා අතර එයට ප්‍රධාන සාධකය වන්නේ පෝෂ්‍යදායී ආහාර හිඟකම වන බැවින්, මාතෘ හා ළමා මන්දපෝෂණය දුරලීමට අවශ්‍ය පෝෂ්‍යදායී ආහාර දුප්පත් ජනතාවට ලබා දීම ප්‍රමුඛතාවය කරගත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසරය සුරැකීමෙන් නිරෝගී රටක් ගොඩනැගීම,— වර්තමාන ශ්‍රී ලංකාවේ පරිසර දූෂණය ඉහළ යාම හේතුවෙන් ජලයේ හා ආහාරවල විකිරණශීලී බව වැඩි වී ඇති අතර අනාගතයේදී මිනිසාට වැළඳෙන ඇතැම් රෝගවල රෝග නිධානය පවා සොයා ගැනීම අපහසු විය හැකි බැවින්, මේ පිළිබඳ වැඩිදුර විමර්ශනය කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කර වාර්තාවක් කැඳවා, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් රටේ ජනතාවගේ නීරෝගීභාවය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ ආරක්ෂාවට කෘෂිකර්මය සුරක්ෂිත කිරීම,— ධනවාදයේ තුන්වැනි කාර්තුව වන දෙවැනි ලෝක යුද්ධයෙන් පසු කාලයේදී හරිත විප්ලවයත් සමඟ කෘෂිකාර්මික ජීවන රටාව සම්පූර්ණයෙන්ම වෙනස් වීම හේතුවෙන් වර්තමාන ලෝක ප්‍රජාව මුහුණ දී ඇති පරිසර දූෂණය, නීරෝගී බව නැතිවීම හා පිරිසිදු ආහාර නොමැතිවීම ආදී අවදානම් තත්ත්වයන්ගෙන් ශ්‍රී ලංකාව ආරක්ෂා කර ගැනීම සඳහා ජනතාව තිරසාර කෘෂිකර්ම භාවිතයන්ට පෙළඹවීමෙන් හා ගොවීන් ආරක්ෂා කෙරෙන රාජ්‍ය ප්‍රතිපත්ති රට තුළ ස්ථාපිත කරවීමෙන් රටේ අනාගතය සුරක්ෂිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංකීර්ණ ගෝලීය වෙළඳපොළ නිසා ජනතාවට ඇතිවන ගැටලු අවම කිරීම,— ගෝලීයකරණය විසින් හඳුන්වාදුන් ලෝක වෙළඳ රටාව මිනිසාගේ මනස ආක්‍රමණය කිරීම හේතුකොට ගෙන ඔහු පාරම්පරිකව ගෙන ආ හර පද්ධතීන් හා දියුණු දාර්ශනික චින්තනයන් මිනිස් මනස තුළින් උදුරා දැමීම වර්තමානය වන විට ශ්‍රී ලාංකිකයින්ට ද පොදු බැවින්, වෙළඳපොළ ආර්ථිකය තුළ ගොඩනැගෙන සංකීර්ණ ජීවන රටාව හා ඒ සමග පැන නගින සංකීර්ණ සමාජීය ප්‍රශ්නත් විසඳා ගනිමින් සහනශීලී දිවි පැවැත්මකට යා යුතු වන්නේ කෙසේද යන්න පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් හා බුද්ධිමය සංවාදයක් රට තුළ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට අවශ්‍ය සීනි රට තුළ නිපදවීම,— ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන සීනි නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් ශ්‍රී ලංකාව සතුව ඇති බැවින්, මනා කළමනාකාරීත්වයකින්, කාර්යක්ෂමව හා සැලසුම් සහිතව කටයුතු කර රටට අවශ්‍ය සීනි ප්‍රමාණය මෙරට නිෂ්පාදනය කිරීමට හා සීනි පිරිපහදු කිරීමට අවශ්‍ය කර්මාන්තශාලා රජය මගින් ස්ථාපනය කර සීනි කර්මාන්තය රැක ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— නකල්ස් රක්ෂිතය ආරක්ෂා කිරීම,— සමස්ත ශ්‍රී ලාංකීය පරිසර පද්ධතියටම බලපෑම් කළ හැකි සංවේදී පරිසර පද්ධතියක් වන නකල්ස් රක්ෂිත වනාන්තරය මේ වන විට මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් දැඩි තර්ජනයකට ලක්වී ඇති අතර වත්මන් පරපුරට මෙන්ම අනාගත මිනිස් පරපුරට ද මෙම පරිසර විනාශය හේතුවෙන් අවදානමකට මුහුණ පෑමට සිදු වන බැවින්, මිනිස් තර්ජන ඉවත් කර නකල්ස් රක්ෂිතයේ ස්වාධීන පැවැත්ම කඩිනමින් තහවුරු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.117/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳව විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳව අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳව ගවේෂණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බුද්ධිමය දිළිඳු බව තුරන් කිරීම,— භෞතික වෙළඳ භාණ්ඩ සැරිසරන වේගයට සාපේක්ෂව දැනුම, බුද්ධිය හා මානව හර පද්ධතීන් ජනතාව වෙත ළඟා නොවීම හේතුවෙන් නොදැනුවත්කම හිස එසවීම තුළින් බුද්ධිමය දිළිඳුභාවය අද අප රට තුළ දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුවක් වුවද, ඒ පිළිබඳව රට තුළ ඇත්තේ අඩු අවධානයක් බැවින්, රටේ ජනතාවගේ බුද්ධිමය දිළිඳු බව නැති කිරීමට සියලු වයස් කාණ්ඩයන් ආවරණය වන පරිදි විධිමත්ව සැලසුම් කරන ලද ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කල් ඉකුත් වූ ඖෂධ භාවිතය නැවැත්වීම,— මේ වන විට ශ්‍රී ලංකාව තුළ කල් ඉකුත් වූ ඖෂධ වෙළඳපොළට හා රජයේ රෝහල් තුළ භාවිතයට පැමිණීමේ අවදානමක් ඇති බැවින් රජයේ අදාළ සියලු අංශ මැදිහත්වී ක්‍රියාකාරී සැලසුමක් සකස් කර කල් ඉකුත් වූ ඖෂධ වෙළඳපොළෙන් ඉවත් කිරීම හා ආනයනය කිරීම නැවැත්වීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම පාලනය කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට හඳුනා නොගත් ඒඩ්ස් රෝගීන් 3000 කට ආසන්න ප්‍රමාණයක් සිටින බවට වාර්තා පළ වී ඇති බැවින් ඔවුන් හඳුනාගෙන ප්‍රතිකාර සඳහා යොමු කිරීමටත්, ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීමටත් ඵලදායී සුදුසු ව්‍යාපෘතියක් කඩිනමින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.121/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශයන්හිදී ලිංගික අතවරයට ලක්වන කාන්තාවන්ට සහන සැලසීම,— ශ්‍රී ලංකාවේ කාන්තාවන් ගෘහ සේවයට විදේශ ගතවීමෙන් පසු සිදු වන අතවරයන් හේතුවෙන් සිදුවන ගැබ් ගැනීම් නිසා ශ්‍රී ලාංකීය සමාජය තුළ නිර්මාණය වී ඇති ගැටලු සහගත තත්ත්වයන් සමනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකසා ක්‍රියාත්මක කිරීමට විද්වතුන් හා එම සිදුවීම් හා බැඳුණු පුද්ගල කණ්ඩායම්වලින් සැදුම්ලත් කමිටුවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.122/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වන රක්ෂිත හා අභය භූමිවල ආරක්ෂාව දැඩි කිරීම සඳහා නීති සම්පාදනය කිරීම,— මෑතක සිට ශ්‍රී ලංකාවේ රක්ෂිත වනාන්තර සහ අභය භූමි විනාශය වැඩි වෙමින් පවතින අතර ශ්‍රී ලාංකීය පාරිසරික සමතුලිතතාවට ඉන් දැඩි තර්ජනයක් එල්ල වෙමින් පවතින බැවින් මෙම විනාශය නැවැත්වීම සඳහා ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සැකසීමට මෙන්ම පවතින නීති ප්‍රතිපාදන විධිමත් හා දැඩි බවකින් යුක්ත වන ලෙස සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.123/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විවිධ ආගමික කණ්ඩායම්වලින් සිදු වන සමාජ බලපෑම් පිළිබඳව අධ්‍යයනය කිරීම,— ප්‍රධාන ධාරාවේ ආගමික මතවාදයන් විවේචනය කරමින්, එම ආගම්හි අනු කණ්ඩායම් ලෙස තම නිර්වචන හා පැහැදිලි කිරීම් සමාජගත කරන, නව මතවාද ඉදිරිපත් කරමින් එම මතවාද පිළිගත් පුද්ගලයින් එක් රැස් කර ගන්නා, ආගමික හා වෙනත් මුහුණුවරකින් සමාජගත වී ඇති කණ්ඩායම් පිළිබඳ අධ්‍යයනය කරමින් ඔවුන්ගේ මතවාද, ක්‍රියාකාරීත්වයන් හා සමාජයට ඔවුන් නිසා ඇති වන බලපෑම් කවරාකාරද යන්න පිළිබඳ තක්සේරුවක් ලබා දීමට පිළිගත් ආගමික නායකයන්ගෙන් හා විද්වතුන්ගෙන් සැදුම් ලත් කමිටුවක් පත් කර, වාර්තාවක් කැඳවා එහි නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.124/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉහළ ප්‍රමිතියෙන් යුත් මැටි භාජන නිෂ්පාදනය කිරීම,— ආහාර පිසීමේදී ගෑස් හා විදුලිය අපතේ නොයන ලෙස ඉක්මනින් තාපය අවශෝෂණය කර ගන්නා මැටි භාජන නිෂ්පාදනය කර වෙළඳපොළට ඉදිරිපත් කිරීමට, අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීමට හා මැටි භාජන භාවිතයෙන් සෞඛ්‍යාරක්ෂිතව ආහාර පිසීමට ඇති හැකියාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ජාතික මට්ටමේ වැඩ සටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.125/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයට බුදු දහමින් ආභාෂය ලබා ගැනීම,— බුදුන් වහන්සේගේ සිත පිළිබඳ ඇතැම් විග්‍රහයන් නූතන විද්‍යාවට හසු නොවන තරම් ගැඹුරු බැවින්, ඒ පිළිබඳ පර්යේෂණ කිරීමට හා වර්තමානයේ අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයේ ඇති ගැටලු සඳහා බුදු දහම ඇසුරින් නිර්වචන හා විසඳුම් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි, අදාළ ක්ෂේත්‍රය පිළිබඳ හසල දැනුමක් ඇති දේශීය හා විදේශීය විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවා, ඒ හරහා බුදු දහම දේශීය හා විදේශීය වශයෙන් ප්‍රචලිත කිරීමටත්, ශ්‍රී ලංකාවේ කීර්ති නාමය ඉහළ නැංවීමටත්, අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයේ පුනරුදයක් ඇති කිරීමටත් රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.126/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂයය ජනප්‍රිය කරවීම,— විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂයය ජනප්‍රිය කිරීම සඳහා මූලික වශයෙන් පාසල් විෂයය නිර්දේශයට එම විෂයය ඇතුළත් කිරීම හා විශ්වවිද්‍යාලවල පුරාවිද්‍යා විෂය පථය තවදුරටත් පුළුල් කිරීමට හා පහසුකම් ලබාදීම සඳහා කටයුතු කිරීමත්, එමගින් පුරාවිද්‍යා විෂයය රට තුළ ව්‍යාප්තවීම හරහා බිහිවන උගතුන්ගෙන් රටට යහපත් සේවයක් ලබා ගැනීමත් අරමුණු කරගත් ජාතික වැඩසටහනක් දිගුකාලීනව සැලසුම් සහිතව නිර්මාණය කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.127/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආහාරවල ඇති වස විෂ පිළිබඳ සොයා බැලීමට විශේෂ ප්‍රමිති ආයතනයක් පිහිටුවීම,— කෘෂිකර්මාන්තයේදී භාවිතා කෙරෙන රසායන ද්‍රව්‍ය හේතුවෙන් ආහාර ද්‍රව්‍යයන්ට ද වස විෂ මිශ්‍රවී ඇති අතර, ඒ පිළිබඳව සොයා බැලීමට අදාළ ප්‍රමිති ආයතනයක් දැනට ශ්‍රී ලංකාව තුළ පිහිටුවා නොමැති බැවින් එම කාර්යය සඳහා විශේෂ ප්‍රමිති ආයතනයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.128/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින් සිඟමනට යොදාගන්නා දරුවන් පුනරුත්ථාපනය කිරීම,— ශ්‍රී ලංකාවේ යාචකයින් දරුවන් සමග සිඟමන් යැදීම තහනම් කර, සිඟමන සඳහා යොදා ගන්නා දරුවන් පුනරුත්ථාපනය කර, ඔවුන් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම සඳහා අවශ්‍ය ජාතික මට්ටමේ වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.129/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ භික්ෂුණී ශාසනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීම,— මහා ප්‍රජාපතී ගෝතමී තෙරණින්වහන්සේගෙන් ඇරඹුණු භාරතීය භික්ෂුණී ශාසනය සංඝමිත්තා තෙරණින්වහන්සේගේ ලංකාගමනයෙන් ශ්‍රී ලංකාව තුළ මැනවින් ස්ථාපිත වුවද, පසුකාලීනව අභාවයට ගිය බැවින්, මෑත යුගයේ දී ශ්‍යාමෝපාලි මහා නිකායේ රංගිරි දඹුලු පාර්ශ්වය විසින් යළි ස්ථාපනය කරන ලද අතර, එලෙස ස්ථාපනය කරන ලද භික්ෂුණී ශාසනයට නිසි පිළිගැනීමක් ලබාදීම සඳහා රජය ත්‍රෛනිකායික මහා නායක ස්වාමීන්වහන්සේලා ඇතුලු අදාළ සියළු ක්ෂේත්‍රයන්ගේ මූලිකත්වයෙන් නිසි සංවාදයක් ඇරඹිය යුතු යැයි ද, එම සංවාදය අවසානයේ විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ ශ්‍රී ලංකාව තුළ භික්ෂුණී ශාසනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වැඩපිළිවෙළක් සැකසිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.130/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය භික්ෂු සංස්ථාව ව්‍යුහාත්මකව විධිමත් කිරීම,— ශ්‍රී ලාංකීය භික්ෂු සංස්ථාව තුළ සංඝයාවහන්සේලා පාර්ශ්ව ගත වීම හේතුවෙන් ව්‍යුහාත්මකව අසංවිධිත වී ඇති අතර එම නිසා ජාතික හා ජාත්‍යන්තර අභිවාර උපචාරයන්හිදී සංඝයා වහන්සේලා ඒකමතික නොවීම රටට අහිතකර ලෙස බලපාන බැවින් සමස්ථ සංඝ සමාජයේ ඒකමතිකත්වය ඇති කර ගැනීමට හැකි වැඩපිළිවෙළක් සැකසීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.131/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලාභදායී ආයතනයක් කිරීම,— ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලාභදායී ආයතනයක් ලෙස ජනතාවාදීව සංවර්ධනය කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමට විද්වත් මණ්ඩලයක් පත් කර ඔවුන්ගේ නිර්දේශයන්ට අනුව සංස්ථාවේ පවතින වංචා, දූෂණ හා පරිපාලනමය ගැටලු විසඳා ඵලදායී ජාතික ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය පරිසරය රජය මැදිහත්ව නිර්මාණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.132/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඖෂධ සඳහා අවශ්‍ය ප්‍රමාණයට ගංජා වැවීමට දේශීය වෛද්‍යවරුන්ට අවසර ලබා දීම,— ඉන්දියාවේ සිට රහසිගත මාර්ග ඔස්සේ රට තුළට ගෙන්වන රසායනික ද්‍රව්‍ය මිශ්‍රිත ගංජා භාවිතා කර නිපදවන දේශීය ඖෂධවල ගුණාත්මක බව අඩුවන බැවින්, ආයුර්වේද ඖෂධ නිපදවීමේදී තම ඖෂධවල ගුණාත්මක බව ආරක්ෂා කර ගැනීම සඳහා ගංජා අත්‍යවශ්‍ය ඖෂධයක් ලෙස යොදා ගන්නා රජයේ පිළිගත් ආයුර්වේද වෛද්‍යවරුන්ට සීමාවන් සහිතව ගංජා ශාකය වැවීමට අවසර ලබාදීම සඳහා අවශ්‍ය නීති සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.133/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— එළවළු ගොවීන්ට සාධාරණ මිලක් ලබා දීම,— එළවළු තොග වෙළඳාමේදී ක්‍රියාත්මක වන කප්පම් ගැනීම හා මිල තීරණය කිරීම් ආදී ක්‍රියා හරහා ගොඩනැගී ඇති සංවිධානාත්මක වෙළඳ ඒකාධිකාරයන් නිසා එළවළු ගොවීන්ට සාධාරණ මිලක් ලබා දීමට මෙතෙක් ක්‍රියාත්මක කළ සැලසුම් අසාර්ථක වී ඇති බැවින්, ගොවියාට සාධාරණ මිලක් ලබා දීමේ මූලික අරමුණ කරගත් බලපෑම් වලින් තොර වෙළඳපොළක් රාජ්‍ය වෙළඳ ආයතන මැදිහත්වී නිර්මාණය කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.134/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන් හා පාසල් වෑන් රථ රියැදුරන් යන පිරිස් සඳහා දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේදයන් තුළින් සරළව පැහැදිලි කර, රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම සඳහා දරුවා සමාජ අභියෝගයන් හමුවේ ආරක්ෂා කරන්නේ කෙසේද යන්න පිළිබඳව සංවාදයක් පැවැත්වීමට ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.135/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කාන්තාවන්ට ඇතිවන පීඩාවන් අවම කිරීම,— වත්මන් ගෝලීය සමාජය තුළ කාන්තාවන්ට සිදුවන පීඩාවන් වන ශ්‍රම හා ලිංගික සූරාකෑමට ලක්වීම, පෞද්ගලික දේපළ ක්‍රමය පුරුෂ කේන්ද්‍රීයව විකාශනය වීම, අසමාන ලෙස සැලකීම හා පවුල් සංස්ථාව තුළ සිරගත වීම නිසා ශ්‍රම සංචලතාවයට බාධා ඇතිවීම යන කරුණු ශ්‍රී ලාංකික

කාන්තාවන්ට ද ප්‍රධාන වශයෙන් පොදු වන බැවින්, ඔවුන්ගේ යහපැවැත්ම වෙනුවෙන් මෙම පීඩාකාරී වාතාවරණය සමනය කර සහන සැලසීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.136/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නගා සිටුවීම,— ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති පුරාවස්තු සංරක්ෂණය කිරීමට හැකියාවක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට නොමැත්තේ පවත්නා මානව හා භෞතික සම්පත්හි අඩුව නිසා වන හෙයින්, විද්වත් මණ්ඩලයක් මගින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඇති අඩුපාඩුකම් පිළිබඳ සොයා බලා, ඒවා සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.137/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දුර ගමන් සේවා බස් රථවල ගමන් ගන්නා මගීන්ට සෞඛ්‍යාරක්ෂිත ආහාර පාන ලබා ගැනීමට පහසුකම් සැලසීම,— දුර ගමන් සේවා බස් රථ ආහාර පාන ගැනීම සඳහා නතර කරනු ලබන ආපනශාලාවන්හි ප්‍රමිතිය ඉතා පහළ මට්ටමක පවතින බැවින් එය මගී ජනතාවගේ සෞඛ්‍යයට අහිතකර වන අතර, එම ආපනශාලාවල ප්‍රමිතිය ඉහළ නැංවීමට නිරන්තරව පසු විපරම් කළ හැකි වන පරිදි සකස් කරන ලද ජාතික වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.138/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රජය සතු වැවිලි සමාගම් ලාභදායී ආයතන බවට පත් කිරීම, — රජය සතු වැවිලි සමාගම් පාඩු ලබන ආයතන බවට පත්වී ඇති බැවින්, විද්වත් කමිටුවක් පත්කර එම ආයතනවල ලාභදායීත්වය වර්ධනය කිරීමට අවශ්‍ය නිර්දේශ සකස් කර, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් එම සමාගම්වල ලාභදායීත්වය ඉහළ දැමීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.139/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වන රක්ෂිත තුළ සිදුවන නීති විරෝධී ක්‍රියා නැවැත්වීම,— ශ්‍රී ලංකාවේ වන රක්ෂිත තුළ සිදුවන නීති විරෝධී වගාවන්, විවිධ ඉදිකිරීම්, වනාන්තර එළිකිරීම් හා රක්ෂිත සීමා මායිම් වෙනස් කිරීම ආදී වන විනාශයට හේතුවන මිනිස් ක්‍රියාකාරකම් වැටලීමට විශේෂයෙන් සවිබල ගන්වන ලද පොලිස් වන ආරක්ෂක ඒකකයක් පිහිටුවීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.140/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කොරල්පර සංරක්ෂණය කිරීම,— සාගර ජලයේ උෂ්ණත්වය ඉහළ යෑම හා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් කොරල්පර විනාශ වීමේ තර්ජනයට ලක්ව ඇති බැවින්, ශ්‍රී ලංකා මුහුදු කලාපය අවට ඇති කොරල්පර ආරක්ෂා කර ගැනීමට හා නව කොරල්පර නිර්මාණය වීමට උචිත පරිසර පද්ධති සකස් කිරීම සඳහා අවශ්‍ය නව නියාමනයන් සකස් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.143/'15

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා,— ගවයින් සඳහා සුදුසු තෘණ බිම් වෙන් කිරීම,— ආසන්න වශයෙන් ගවයින් 250,000කට පමණ තෘණ භූමි අවශ්‍යව සිටින බැවින් සහ කිරි නිෂ්පාදනය වැඩි කිරීමේ රජයේ ප්‍රතිපත්තිය සපුරාගැනීම සඳහා වෙන් කරන ලද තෘණ භූමි දිස්ත්‍රික්කය තුළ පිහිටා නොමැතිකම නිසා, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ සුදුසු තෘණ භූමි ප්‍රකාශකර, වෙන්කර ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.145/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— රජයේ ආයතනවලින් ජනතාවට සිදුවන අකටයුතුකම් පිළිබඳ සොයා බැලීමට ආයතනයක් පිහිටුවීම,— රජයේ ආයතන මගින් විවිධ සේවාවන් ලබාගැනීම සඳහා පැමිණෙන මහජනතාවට සිදුවන අකටයුතුකම් සහ අසාධාරණකම් පිළිබඳ සොයා බැලීම සඳහාත්, එම අසාධාරණකම් විභාග කිරීම සඳහාත් නෛතික බලයක් සහිත ආයතනයක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.150/'15

ගරු හේෂා විතානගේ මහතා,— උපාධිධාරීන් සඳහා රැකියා ලබා දීමේදී නිසි ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ උපාධිධාරීන්ට රැකියා ලබා දීමේදී මෙතෙක් කල් ක්‍රියාත්මක වූ පක්ෂ පාට භේද ක්‍රමය නොසලකා සාධාරණය ඉටුකිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සැලසුම් කර එය ප්‍රතිපත්තියක් ලෙස සම්මත කිරීමට පියවර ගන්නා ලෙසත්, දේශපාලනඥයන් හමුවේ උපාධිධාරීන් හැල්ලුවට පත් නොකිරීමට වගබලා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.151/'15

ගරු හේෂා විතානගේ මහතා,— වතු ආශ්‍රිතව ජීවත්වන දමිළ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම,— වතු ආශ්‍රිත දමිළ ජනතාව ජීවත්වන පරිසරය තුළ විදුලිය, ජල පහසුකම් සහ යටිතල පහසුකම් අවම මට්ටමක පවතින අතර එම තත්ත්වය පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලටත්, එම ජනතාවගේ පෞද්ගලික ජීවිතයටත් බාධා ඇතිකරන බැවින්, මෙම ලයින් නිවාස සංස්කෘතිය නිමා කර ඒ සඳහා නව විධිමත් තනි නිවාස ක්‍රමයක් සකස් කිරීමට අවශ්‍ය කඩිනම් වැඩසටහනක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.154/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර දිස්ත්‍රික්කය තුළ මහල් නිවාස යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීම,— මහනුවර දිස්ත්‍රික්කයේ පවතින ඉඩම් හා නිවාස හිඟයට පිළියමක් වශයෙන් මහනුවර ප්‍රදේශයේ පිහිටා ඇති රාජ්‍ය වැවිලි ආයතනවලට අයත් වගා නොකළ ඉඩම් තෝරාගෙන මහල් නිවාස ක්‍රමයක් ඇතිකොට නිවාස නොමැති මහනුවර දිස්ත්‍රික් මධ්‍යම පාන්තික ජනතාවට කඩිනමින් නිවාස ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.155/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— වසර 12 ක ක්‍රියාන්විත රාජකාරියේ නිරතව සිටි ත්‍රිවිධ හමුදා සෙබළුන්ට විශ්‍රාම වැටුප් ලබා දීම,— ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදා සේවයේ වසර 22 ක් සම්පූර්ණ වූ පසු විශ්‍රාම යෑමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන බැවින්, උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේ නියැලී වසර 12 ක් අඛණ්ඩව සේවය කොට එම සේවාවෙන් ඉවත් වී සිටිනා අයවලුන් දැනට ඉතා අසරණ තත්ත්වයෙන් පසුවන බැවින් එම ත්‍රිවිධ හමුදාවේ හා පොලීසියේ සේවය කළ අයට අර්ධ විශ්‍රාම වැටුපක් ලබා දීමේ ක්‍රමවේදයක් කඩිනමින් සකසා එම අයට සහනයක් සැලසීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.156/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ පවත්නා මාර්ග තදබදය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ දෙවැනි අගනගරය වන මහනුවර නගරය දේශීය හා විදේශිකයන්ගේ සංචාරක මධ්‍යස්ථානයක් වන හෙයින් ද, මහනුවර නගරයට එදිනෙදා විශාල පිරිසක් පැමිණෙන අතර එම ජනතාව මහනුවර නගරයේ හා අවට මාර්ගවල ඇති අධික රථ වාහන තදබදය නිසා මහත් අසීරුතාවයකට පත්වන බැවින් ද, මහනුවර නගරයේ මාර්ග තදබදය අවම කිරීම සඳහා කඩිනම් විසඳුමක් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.157/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ මුස්ලිම් පිරිමි පාසලක් ආරම්භ කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ මුස්ලිම් ජනතාව ඉතා වැඩි පිරිසක් ජීවත් වන අතර, මහනුවර නගරය ආශ්‍රිතව මුස්ලිම් පිරිමි පාසලක් පිහිටුවිය යුතු යැයි දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවගේ ද ඉල්ලීමක්ව පවතින බැවින්, ඉතා කඩිනමින් මහනුවර නගරයේ මුස්ලිම් පිරිමි පාසලක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු සැලසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.158/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ පිහිටි ජනප්‍රිය පාසල් සඳහා පළමු ශ්‍රේණියේ දරුවන් වෙනුවෙන් නව ගොඩනැගිලි ඉදිකිරීම,— මහනුවර නගරය ආශ්‍රිතව ජනප්‍රිය පාසල් සඳහා පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමට විශාල පිරිසක් ඉල්ලුම් කළත්, එම පාසල්වල ඉඩකඩ සීමිත හෙයින්, දරුවන් ඇතුළත් කිරීම ඉතා අසීරු වී ඇති බැවින් මහනුවර නගරය ආශ්‍රිත ප්‍රධාන පාසල්වලට පළමුවැනි ශ්‍රේණියේ පන්ති පැවැත්වීම සඳහා නව ගොඩනැගිලි ඉතා කඩිනමින් ඉදිකර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.159/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර පල්ලේකැලේ නිදහස් වෙළඳ උද්‍යාන ක්‍රමවත්ව පුළුල් කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ විරැකියාවෙන් පෙළෙන තරුණ තරුණියන් විශාල පිරිසක් සිටින බැවින්, එම අයට රැකියා අවස්ථා කඩිනමින් සපයා දීම සඳහා මහනුවර පල්ලේකැලේ ප්‍රදේශයේ පිහිටා ඇති නිදහස් වෙළඳ උද්‍යාන දෙක ක්‍රමවත් ලෙස සකසා වැඩි පිරිසකට රැකියා අවස්ථා ලබා ගැනීමට අවස්ථාව සැලසීමට කඩිනමින් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.160/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව යළි ස්ථාපනය කිරීම,— අධිරාජ්‍යවාදී පාලන කාලයේදී අසරණ වූ උඩරට ප්‍රදේශවාසී ජනතාවට සහන සැලසීම උදෙසා ස්ථාපිත කර තිබූ උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව පසුගිය පාලන කාලය තුළ අක්‍රීය තත්ත්වයට පත් කිරීම නිසා උඩරට ජනතාවට සිදුවී ඇති අසාධාරණයන් සාධාරණය කිරීම සඳහා උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව නැවත ක්‍රමවත්ව ස්ථාපිත කරලීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සැලසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.162/'15

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පවතින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ සේවක සංඛ්‍යා පුරප්පාඩු, ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කරගෙන පිරවීම සහ තරඟ විභාගයෙන් නිදහස් කර III ශ්‍රේණියට පත්කිරීම,— උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පවතින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ සේවක සංඛ්‍යා පුරප්පාඩු පිරවීම සම්බන්ධව නිසි විශ්ලේෂණයක් කර මෙම තනතුරුවලට අදාළ රාජකාරිවල නිරත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හා ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය සැලකිල්ලට ගෙන ඔවුන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තරඟ විභාගයෙන් නිදහස් කර අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.163/'15

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— උතුරු පළාතේ පළාත් සභාව යටතේ ඇති පාසල්වල වැඩ බලන විදුහල්පතිවරුන් විදුහල්පති තරඟ විභාගයෙන් නිදහස් කර, එම නිලධාරීන් විදුහල්පති සේවයේ III ශ්‍රේණියට පත් කිරීම,— උතුරු පළාත් සභාව යටතේ ඇති පාසල්වල දීර්ඝ කාලයක් සේවයේ නියුතු ශ්‍රී ලංකා ගුරු සේවයට අයත් වැඩබලන විදුහල්පතිවරුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය හා

කුසලතාවය සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ තරඟ විභාගයෙන් නිදහස් කර, එම නිලධාරීන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.168/'16

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ජාතීන් අතර ජාතික සංහිඳියාව ගොඩනැංවීම,— ජාතික සංහිඳියාව හා ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය සහ එකමුතුව වඩාත් ඵලදායී ලෙස ගොඩනැගීම සඳහා දීර්ඝ කාලීන ඉලක්කයන්ට මුල පිරීමේ අරමුණින්, ශ්‍රී ලංකාව තුළ සෑම දෙමළ මාධ්‍ය පාසලකම සිංහල මාධ්‍යයෙන් උගන්වන අංශයක් ආරම්භ කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.169/'16

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නව ක්‍රීඩා පනතක් හඳුන්වාදීම,— දිස්ත්‍රික් ක්‍රීඩා සංගම්වල ඡන්දයෙන් ක්‍රීඩා පාලක මණ්ඩලවලට නිලධාරින් තේරී පත්වීමේ ක්‍රමය වෙනුවට අලුත් ක්‍රමවේදයක් හඳුන්වා දී, එමගින් එම නිලධාරීන්ගේ ක්‍රියා කලාපය, මහජනතාවට හෝ පාර්ලිමේන්තුවට හෝ වගකියන අයුරින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවේ දියුණුව සහ අභිවෘද්ධිය සඳහා නව ක්‍රීඩා පනතක් හඳුන්වා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

## 2016 ජුනි මස 21 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

129/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ගංගා ආශ්‍රිතව අනවසර වැලි ගොඩ දැමීම්, මැණික් ගැරීම් හා රත්රන් කැණීම් සිදුවන බවත්;

(ii) මේ නිසා එම ගංගාවන්ට විශාල වශයෙන් හානි සිදුවන බවත්;

(iii) එය ජන ජීවිතයට ද සෘජුව බලපාන බවත්;

(iv) වගකිව යුතු ආයතන තුළ එම අකටයුතුකම් වැළැක්වීමට ප්‍රමාණවත් පහසුකම් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගංගා ආශ්‍රිතව සිදුවන උක්ත අකටයුතුකම් මැඩලීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවරයන් කවරේද;

(iii) 2013.01.01 දින සිට 2014.06.30 දින දක්වා (අ)(i)හි සඳහන් වැරදි පිළිබඳ ලැබුණු පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සම්බන්ධව ගත් නීති ක්‍රියාමාර්ග, එක් එක් පැමිණිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) උක්ත පරිසර හානි මැඩලීමට දැනට පවත්නා නීති පද්ධතිය ප්‍රමාණවත් වන්නේද;

(ii) නොඑසේ නම්, පවතින නීති වෙනස් කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

355/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුනාමි ව්‍යසනයෙන් පීඩාවට පත් ජනතාවගේ නිවාස ඇතුළු පොදු පහසුකම් සැපයීම පිණිස සෞදි අරාබිය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සංවර්ධන අරමුදලින් මූල්‍යාධාර ලබා දුන්නේද;

(ii) එම ආධාර මුදල් උපයෝගී කරගෙන ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘතීන් කවරේද;

(iii) එම එක් එක් නිවාස ව්‍යාපෘතීන් සඳහා වියදම් කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, අනුග්‍රහය දක්වන ලද රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන එක් එක් ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

445/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008 වර්ෂයේදී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා, මුදල් අමාත්‍යවරයා වශයෙන් රාජ්‍ය බැංකුවලින් සමූපකාර ව්‍යාපාරයට ලබාදී තිබූ සියලුම ණය කපා හැරීමට ප්‍රතිපාදන වෙන් කරනු ලැබුවේද;

(ii) ඒ බව සනාථ කරමින් එවකට විෂයභාර අමාත්‍යවරයා වූ බන්දුල ගුණවර්ධන මන්ත්‍රීවරයා 2015.11.05 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කරනු ලැබුවේද;

(iii) එක් එක් සමූපකාර සමිතිවලින් කපා හරින ලද ණය පිළිබඳ යථා තත්ත්වය අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කර දැනුම් දෙන බව කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා 2015.11.05 දින පාර්ලිමේන්තුවට දන්වනු ලැබුවේද;

(iv) මහජන බැංකුව විසින් සමූපකාර සමිතිවලට ලබාදී තිබූ ණය කපාහැරීමට තීරණය කර ඇති නමුත් එම තීරණය මේ දක්වා කිසිදු දිස්ත්‍රික්කයක ක්‍රියාත්මක වී නොමැති බවට රාජ්‍ය අමාත්‍යවරයා 2015.11.05 දින පාර්ලිමේන්තුවේදී දෙන ලද පිළිතුර නිවැරදිද;

(v) ඉහත (iv) හි තීරණය ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත ණය කපාහැරීමෙන් සමූපකාර සමිතිවලට යම්කිසි ධෛර්යයක් ලබාදීමට ගත් තීරණය ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව ගන්නා ඉදිරි පියවර සමූපකාර සමිතිවලට දන්වා යවන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

448/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය විවෘත කරන ලද දිනය කවරේද;

(ii) එදින සිට මේ දක්වා එම ක්‍රීඩාංගණයේ නඩත්තු කටයුතු සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම ක්‍රීඩාංගණය විවෘත කළ දින සිට මේ දක්වා පැවති ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩා තරඟවලින් ඉපයූ ආදායම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

453/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට, ශ්‍රී ලංකාව ක්‍රියාත්මක කරන නිදහස් වෙළඳ ගිවිසුම් මගින්, අහිමි වී ඇතැයි සැලකෙන බදු ආදායම වර්ෂ 2005 සිට 2015 දක්වා එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ආරම්භ වූ දින සිට මේ දක්වා, රේගු දෙපාර්තමේන්තුවට අහිමි වී ඇතැයි සැලකෙන බදු ආදායම කොපමණද;

(iii) ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මකවීම ආරම්භ වූ දිනයේ සිට මේ දක්වා, ආනයන-අපනයන සහ දෙරට අතර වෙළඳ ශේෂය පිළිබඳ රේගු දත්තයන් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

467/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2001 සිට 2016 දක්වා සෑම වසරකම ජනවාරි පළමු දිනට—

(i) ලෝක වෙළඳපොළේ බොරතෙල් බැරලයක මිල ඩොලර් සහ රුපියල් වලින් කොපමණද;

(ii) දේශීය වෙළඳපොළේ පෙට්‍රල් සහ ඩීසල් ලීටරයක මිල රුපියල් වලින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

494/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය තුළදී ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව විසින් කාල සීමාව ඉක්මවූ (Overage) වාහන ගෙන්වීම සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍රහිමියන්ගේ නම්, ලිපින සහ බලපත්‍ර නිකුත් කරන ලද වාහන වර්ගය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

511/'16

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැලිගම, වෙල්ලක්කා, සමගි මාවතේ පදිංචි ජේ. ජී. ජයන්ත මහතා 2000.07.26 දින ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය සඳහා කොන්දොස්තරවරයකු ලෙස එක් වූ බවත්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අකුරැස්ස ඩිපෝවට අනුයුක්තව ඔහු සේවය කළ බවත්, තම අසනීප තත්ත්වය හේතුවෙන් සෞඛ්‍යමය හේතු මත 2015.01.01 දින වසර 15ක නොකළැල් සේවා කාලයකින් පසුව ඔහු විශ්‍රාම ගත් බවත්;

(ii) පසුගිය වර්ෂය පුරාම අදාළ බලධාරීන් වෙත ඉල්ලීම් කිහිපයක් ඉදිරිපත් කළද විශ්‍රාම ලබන විට ඔහුට ගෙවිය යුතු පාරිතෝෂික මුදල මේ දක්වා ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ප්‍රමාදයකින් තොරව, මෙම පාරිතෝෂික මුදල සම්පූර්ණයෙන්ම ගෙවනු ලබන්නේද;

(ii) එසේ නම්, එම මුදල ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

140/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේදී මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කළ මුළු මුදල කොපමණද; එම ව්‍යාපෘති කවරේද;

(ii) එම එක් එක් ව්‍යාපෘතියට අදාළව ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම මුදල් සපයා ගත් මූලාශ්‍ර කවරේද;

(iv) එම එක් එක් මූලාශ්‍රයෙන් ලබා ගත් මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මුදල් ලබා ගත් මූලාශ්‍රයන් ඉදිරිපත් කළ කොන්දේසි වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ග ඉදිකිරීම්වලදී දූෂණ හා වංචා රැසක් සිදු වී ඇති බවත්;

(ii) ප්‍රමිතිය සම්බන්ධ ගැටලු ඇති බවත්;

(iii) ව්‍යාපෘති නිසා ඉඩම් හා දේපළ අහිමි වන ජනතාවට වන්දි හා වෙනත් සහන ලබාදීම අවම මට්ටමක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) උක්ත (අ)(i) හි සඳහන් ව්‍යාපෘතිවලදී ජනතාවට වන්දි හා වෙනත් සහන ලබාදීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සංවර්ධන ව්‍යාපෘති නිසා පීඩාවට පත් ජනතාවට ලබා දෙන සහන වැඩි කිරීමට එතුමා පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද; කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

449/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.12.14 දින මාතර දී පවත්වන ලද නිපුණතා අභිෂේක වැඩසටහන සඳහා වැය කළ සම්පූර්ණ මුදල කොපමණද;

(ii) එහිදී සිදුවූ මූල්‍යමය අක්‍රමිකතා පිළිබඳව සෙවීමට ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු අධිකාරිය විසින් මූලික විමර්ශනයක් සිදු කර තිබේද;

(iii) JP/E/NAITA/AW/2014/20 දරන විගණන විමසුම මඟින් විගණකාධිපතිවරයා අනාවරණය කළ මූල්‍ය අක්‍රමිකතා කවරේද;

(iv) මෙම වැඩසටහන සඳහා රුපියල් මිලියන 100කට වඩා වියදම් කිරීම සම්බන්ධයෙන් NAITA සභාපතිවරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර තිබේද;

(v) එසේ නම්, ඒ කවර දිනයකදීද; එම පරීක්ෂණවල ප්‍රගතිය කවරේද;

(vi) රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව, ලයිට් හවුස් නමැති පුද්ගලික සමාගම තෝරා ගැනීමේදී NAITA ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වංචනික ක්‍රියාවක් සිදුකර ඇති බැවින් ඇයට එරෙහිව ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

(vii) නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

454/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2015 දක්වා ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සැර මත්වතුර සහ ධාන්‍ය මත්වතුර ප්‍රමාණය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් ලීටර් මිලියන කොපමණද;

(ii) ඉහත සඳහන් වර්ෂවලදී එකී මත්වතුර දෙවර්ගයෙන්, ලැබූ සුරාබදු ආදායම, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් රුපියල් මිලියන කොපමණද;

(iii) 2015 වර්ෂයේදී සැර හා ධාන්‍ය මත්වතුර නිෂ්පාදනය ඉහළ යැමට තුඩුදුන් හේතුන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

469/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 15, මට්ටක්කුලිය, 1 වැනි පටුමග, කදිරානවත්ත, අංක 1/90 ඩී දරන ස්ථානයේ පදිංචි, එම්. එන්. එම්. හකීම් මහතා (ජා. හැ. අංක - 820881966V) 2009.03.21 දින කොළඹ, මෝදර පොලිස් බලප්‍රදේශයේදී ඔහුගේ අංක 200-5464 දරන ත්‍රීවීලර් රථය සමඟ පැහැරගෙන යැම සම්බන්ධයෙන් ඔහුගේ සහෝදරයා වන, මොහොමඩ් ෆර්සාන් මහතා විසින්, මෝදර පොලිස් ස්ථානයේ 2009.03.21 දින අංක CIB/83/371 යටතේ පැමිණිල්ලක් කරන ලද බවත්;

(ii) පොලිස් මූලස්ථානයේ, සිවිල් අපරාධ කොට්ඨාසය මඟින් අංක C8/310/2010 හා 2010.08.05 දිනැති ලිපියකින්, මෙම පැහැර ගැනීම සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදුකිරීම සඳහා කොළඹ දිසා භාර නියෝජ්‍ය පොලිස්පති වෙත යොමු කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත අංකය යටතේ මෝදර පොලිස් ස්ථානයේ කරන ලද පැමිණිල්ලේ සහ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අධීක්ෂණය යටතේ සිදුකරන පරීක්ෂණයේ වර්තමාන ප්‍රගතිය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

472/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම ගුවන් ගමන් වලින් පාඩු ලබන අතරේ ආහාර සැපයීම, ඉංජිනේරු සේවා සහ ගුවන් තොටුපළ සේවා යන ක්ෂේත්‍රයන්හි ලාභ ලබන බව පිළිගන්නේද;

(ii) ගුවන් ගමන් සේවය තවදුරටත් සී/ස ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම තුළ රඳවාගෙන ඉහත (i) හි සඳහන් අනෙකුත් ක්ෂේත්‍ර විකුණා දැමීමේ සැලසුමක් තිබේද;

(iii) එසේ නම්, එයින් සිදු වන්නේ එම සමාගමේ අලාභය තවදුරටත් ඉහළ ගොස් භාණ්ඩාගාරය මත ඇති පීඩනය ඉහළ යෑම බව පිළිගන්නේද;

(iv) ශ්‍රී ලන්කන් ගුවන් සේවය විකිණීමේ සැලසුමක් තිබේද;

(v) එසේ නම්, එම සැලසුමේ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?